*සැ. යු.*- (i) 2018.03.02 දින පළ වූ අංක 2,061 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.
(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2017.12.31 දින දක්වා ලියාපදිංචි පශු වෛද්‍ය නිලධාරීන්ගේ නාමාවලිය ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,062 - 2018 මාර්තු මස 09 වැනි සිකුරාදා - 2018.03.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 400 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 417 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

*සැ. යු.* - ජායා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2018 පෙබරවාරි මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2018 මාර්තු මස 29 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 මාර්තු මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

මගේ අංකය : NWP/MORD/AD/7/7/3-1

**වයඹ පළාතේ පළාත් සභාව**

වයඹ පළාතේ පළාත් සභාවේ 2017 අංක ..................... දරන වයඹ පළාතේ මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය පිළිබඳ ප්‍රඥප්තිය

මෙහි පහත පළකරන වයඹ පළාතේ පළාත් සභාවේ 2017 අංක..............දරන මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය පිළිබඳ ප්‍රඥප්තිය අද දින සිට දින තිහක් ඉකුත් වීමෙන් පසුව වයඹ පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරන බව මෙයින් නිවේදනය කරමි. යම් අයෙකුට මෙම ප්‍රඥප්තියේ අඩංගු විධිවිධාන පිළිබඳ ඉදිරිපත් කිරීමට යම් කරුණක් ඇතොත් ඒවා එදිනට පෙර මා වෙත ඉදිරිපත් කළ යුතු වේ.

ගුණදාස දෙහිගම,
අමාත්‍ය,
මාර්ග, ප්‍රවාහන, නිවාස හා ඉදිකිරීම්, කර්මාන්ත සහ
ග්‍රාම සංවර්ධන පළාත් අමාත්‍ය (වයඹ පළාත.)

මාර්ග, ප්‍රවාහන, නිවාස හා ඉදිකිරීම්, කර්මාන්ත සහ
ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය - වයඹ පළාත,
වයඹ පළාත් සභා සංකීර්ණය,
පතුල් මහල,
කුරුණෑගල.

**වයඹ පළාතේ මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය**

***යෝජිත ප්‍රඥප්ති කෙටුම්පත***

වයඹ පළාත ඇතුළත මෝටර් වාහන මගින්, පාරවල් ඔස්සේ මගීන් ප්‍රවාහන සේවා හා / හෝ භාණ්ඩ ප්‍රවාහන සේවා විධිමත් කිරීම සඳහාද, මාර්ගස්ථ ප්‍රවාහන සේවාවන් සහ වයඹ පළාතට අදාළ වන ප්‍රමාණයට වයඹ පළාත හා සම්බන්ධවන පළාත් ප්‍රවාහන සේවාවන් විධිමත් කිරීම සඳහා ද, එකී විධිමත් කිරීමේ අරමුණු ඉටුකර ගැනීම උදෙසා වයඹ පළාත සඳහා ප්‍රවාහන සේවා අධිකාරියක් පිහිටුවීම සඳහා ද ඒ සම්බන්ධයෙන් හෝ ඊට අනුශංගික කරුණු සඳහා විධිවිධාන සැළැස්වීම සහ 1995 අංක 04 දරන වයඹ පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරී ප්‍රඥප්තිය පරිච්ජින්න කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ

ලුහුඬු නාමය.

1. මෙම ප්‍රඥප්තිය වයඹ පළාත් සභාවේ 2017 අංක ................. දරන වයඹ පළාතේ මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරී ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

ක්‍රියාත්මක දිනය.

2. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ *ගැසට් පත්‍රයේ* පල කරනු ලබන නියමයක් මගින් වයඹ පළාත් ආණ්ඩුකාරවර විසින් අනුමත කරනු ලබන (මෙහි මින්මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන්නේ ය.

1 වන කොටස

**වයඹ පළාතේ මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය**

3. 1995 අංක 04 දරන වයඹ පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය මින් පරිච්ජින්න කරනු ලැබේ.

මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය පිහිටු වීම.

4. i. මෙහි මින් මතු අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන "වයඹ පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරියක්" පිහිටවනු ලැබේ.

ii. ඉහත 4 ( 1 ) උපවගන්තිය මගින් අධිකාරියට ලබා දී ඇති නාමයෙන් එය අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් සහිත නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමට බලය සහිත සංස්ථාපිත ආයතනයක් විය යුත්තේ ය.

5. I. පළාත් අධිකාරිය මතු දැක්වෙන පරිදි අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයින් 7 දෙනෙකුගෙන් සමන්විත විය යුතු ය. අධිකාරියේ සාමාජිකයින්.

II. *(අ)* අමාත්‍යවරයාගේ අනුමැතියෙන් නිල බලයෙන් පත්වන සාමාජිකයින් සහ අමාත්‍යවරයා පත්කළ සාමාජිකයින් පහත දැක්වෙන පරිදි විය යුතු ය.

i. වයඹ පළාත් ප්‍රවාහන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන විධායක මට්ටමේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු,

ii. වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ස්වකීය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු,

iii. වයඹ පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති හෝ ඔහු විසින් නම් කරනු ලබන සහකාර පොලිස් අධිකාරී නිලයට නොඅඩු ඊට උසස් තත්වයේ නිලධාරියෙකු,

iv. ප්‍රවාහනය, නීතිය, කළමණාකරණය, වාණිජ්‍ය, පරිපාලනය හෝ සිවිල් ඉංජිනේරු විද්‍යාව යන ක්ෂේත්‍රවලින් එකක හෝ වැඩි ගණනක සුදුසුකම් ලබා ඇත්තාවූ ද එම විෂයන් පිළිබඳ මනා පළපුරුද්දක් හා දක්ෂතාවයක් දක්වා ඇත්තා වූ බවට විෂයභාර අමාත්‍යවරයා සෑහීමකට පත්වන පුද්ගලයින් 4 දෙනෙකු,

III. අධිකාරියේ සියලුම සාමාජිකයින් අමාත්‍යවරයාගේ අත්සනින් නිකුත් කරනු ලබන ලිපියක් මගින් විධිමත්ව පත්කරනු ලැබිය යුතු වන්නේ ය." එවැනි සියලු පත්වීම් රජයේ *ගැසට් පත්‍රයේ* පලකරනු ලැබිය යුතු වන්නේ ය".

6. i. අමාත්‍යවරයා විසින් ඉහතින් පත් කරන ලද සාමාජිකයින් අතරින් එක් සාමාජිකයකු අධිකාරියේ සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබිය යුතු ය. අධිකාරියේ සභාපති.

ii. සභාපතිවරයාගේ ධුර කාලය ඔහු අධිකාරියේ සාමාජිකත්වය දරන කාලසීමාව හා අමාත්‍යවරයාගේ ප්‍රසාදය ඇතිතාක් කල් විය යුතු ය.

iii. 11 වැනි වගන්තියේ සඳහන් කර ඇති හේතුවක් නිසා, සභාපතිවරයාට සිය ධුරයේ කටයුතු ඉටු කිරීමට අපොහොසත් වන අවස්ථාවක සභාපතිවරයා ලෙස වැඩ බැලීම පිණිස වෙනත් සාමාජිකයකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකිය.

7. යම් තැනැත්තෙකු

i. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු නම්, සාමාජිකයකු වීම සඳහා නුසුදුසුකම්.

ii. ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම්,

iii. පිළිගත් වෛද්‍ය මණ්ඩලයකින් සිහිවිකල් තැනැත්තෙකු බවට තීරණය කරනු ලැබ ඇත්නම් හෝ පූර්ණ අකර්මන්‍යතාවයකට පත්ව ඇත්නම්,

iv. ශ්‍රී ලංකාවේ යම් අධිකරණයක් විසින් අපරාධමය දණ්ඩනයකට යටත් කරනු ලැබ සිටින්නෙකු හෝ වරදකරුවකු නම්,

එම තැනැත්තා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත්කරනු ලැබීමටත්, පත්කර සිටීනම් දිගටම ක්‍රියාකිරීමට නුසුදුස්සෙකු වන්නේය.

සාමාජිකයන්ගේ මූල්‍ය සම්බන්ධතා.

8\. i. අමාත්‍යවරයා විසින් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් යම් තැනැත්තකු පත් කිරීමට පෙර එම තැනැත්තා විසින් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් තම කර්තව්‍ය ඉටු කිරීමේදී අහිතකර බලපෑමක් ඇතිවීමට ඉඩ ඇති අධිකාරියේ කටයුතු වලට අදාල මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් එම තැනැත්තාට නොමැති බවට අමාත්‍යවරයා සෑහීමට පත්විය යුතු ය.

ii. අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු එම ධූරයට පත් කරණු ලැබීමෙන් පසු එවැනි යම් සම්බන්ධතාවක් අත් කරගෙන නොමැති බවට අමාත්‍යවරයා කලින් කල සෑහීමට පත්විය යුතු ය.

iii. අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කිරීමට අමාත්‍යවරයා විසින් යෝජනා කරන යම් තැනැත්තකු, අමාත්‍යවරයා විසින් තත් කාර්ය සඳහා ඉල්ලීමක් කරණු ලබන කවර හෝ අවස්ථාවකදී මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා අවශ්‍ය යැයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන යම් තොරතුරක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

iv. අධිකාරිය විසින් ඇති කර ගනු ලබන හෝ ඇති කර ගැනීමට යෝජිත යම් ගිවිසුමක් පිළිබඳව යම් ආකාරයකින් ඍජුව හෝ අන්‍යාකාරයකට උනන්දුවක් දක්වන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු විසින් තමාගේ සම්බන්ධතාවයේ ස්වභාවය පිළිබඳව අධිකාරියේ රැස්වීමකදී හෙළිදරව් කල යුතු අතර, එසේ හෙළිදරව් කිරීම අධිකාරියේ රැස්වීම් වාර්තාවල වාර්තා ගත කල යුතු අතර, එම ගිවිසුම සම්බන්ධයෙන් අධිකාරිය විසින් පවත්වනු ලබන යම් සාකච්ඡාවකට හෝ අධිකාරිය විසින් ගනු ලබන යම් තීරණයකට එම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයා සහභාගි නොවිය යුතු ය.

අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්.

9\. i. අධිකාරියේ සෑම අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමකදීම සභාපතිවරයා මුලසුන දැරිය යුතු ය. සභාපතිවරයා යම් රැස්වීමකට පැමිණ නොමැති අවස්ථාවකදී පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතරින් යම් තැනැත්තකු එම රැස්වීම සඳහා සභාපතිවරයා ලෙස තෝරා පත් කර ගත යුතු ය.

ii. අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක ගණපූර්ණය 3 දෙනෙකු විය යුතු ය.

iii. අධිකාරිය විසින් සලකා බැලීම සඳහා ඉදිරිපත් වන සෑම කරුණක්ම අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී තීරණය කල යුතු අතර,එම කරුණු රැස්වීමට පැමිණ ඡන්දය පාවිච්චි කරන අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගේ බහුතරයක් විසින් අනුමත කරනු ලැබිය යුතු ය.

iv. යම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු තෝරාපත් කර ගැනීමෙහිලා හෝ පත් කිරීමෙහිලා යම් දෝෂයක් තිබුණ බවට හෝ එවැනි සාමාජික නුසුදුස්සකු වූ බවට පසුව සොයා ගනු ලැබුවහොත් එම තැනැත්තාට සුදුසුකම් තිබූ ලෙස සලකා ඔහු සහභාගි වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමෙහි කරන ලද සියලු ක්‍රියා වලංගු විය යුතු ය.

v. අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගේ යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසාම පමණක් යම් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක කිසිදු ක්‍රියාවක් හෝ කටයුත්තක් බල රහිත නොවිය යුතු ය.

සාමාජිකයන්ගේ ධුර කාලය.

10\. නියමිත කාලයට පෙර තනතුර අත්හැරිය හොත් හෝ 11 හෝ 13 වන වගන්ති යටතේ අමාත්‍යවරයා විසින් තනතුරෙන් ඉවත් කරණු ලැබුවහොත් හෝ හැර පළාත් අධිකාරියේ සෑම සාමාජිකයකුම තම පත්වීමේ දිනයෙහි සිට අවුරුදු 3 ක කාලයක් ධුරය දරයි.

එතකුදු වුවත් සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් පිරවීමට පත්කළ සාමාජිකයකු ධුරය දරන්නේ තම පූර්වගාමියාගේ ධුර කාලයේ ඉතිරි කාල පරිච්ඡේදය සඳහා පමණි.

වැඩ බලන සාමාජිකයින් පත් කිරීම.

11\. අසනීප නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් හේතුවක් නිසා හෝ සිය රාජකාරි ඉටු කිරීමට යම් සාමාජිකයකු තාවකාලිකව අපොහොසත් වේ නම් එම කාලසීමාව සඳහා 5 වන හා 7 වන විධිවිධානයන්ට යටත්ව අමාත්‍යවරයා විසින් සාමාජිකයකු වශයෙන් කටයුතු කිරීමට වෙනත් අයකු පත් කල හැක.

ඉල්ලා අස්වීම.

12\. අමාත්‍යවරයා වෙත තත් කාර්ය සඳහා කරන ලිඛිත දැන්වීමක් මගින් පළාත් අධිකාරියේ කවර හෝ සාමාජිකයකු කවර අවස්ථාවක වුවද සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැක.

13. අමාත්‍යවරයා විසින් ඕනෑම අවස්ථාවක හේතු නොදක්වා ඕනෑම සාමාජිකයකු ධුරයෙන් ඉවත් කළ හැක. ධුරයෙන් ඉවත් කිරීම.

14. ධුරකාලය අවසන් වීමෙන් පසු සාමාජිකත්වය අහෝසිවන සාමාජිකයකු ද, සිය කැමැත්තෙන් හෝ ධුර කාලය තුළ ඉල්ලා අස්වූ සාමාජිකයකු ද නැවත පත් කරනු ලැබිය හැක. එතකුදු වුවත් 13 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් ඉවත් කරනු ලැබූ සාමාජිකයකු නැවත පත්වීමට සුදුසසකු නොවේ. නැවත පත් කිරීම.

15. පළාත් අධිකාරියේ සාමාජිකයන්ට හා සභාපතිවරයාට පළාත් අමාත්‍ය මණ්ඩලයේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික පළාත් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය හැක. අධිකාරියේ සාමාජිකයින් සඳහා පාරිශ්‍රමික.

16. i. පළාත් අධිකාරියේ සභාපතිවරයා සහභාගී වන අධිකාරියේ සෑම රැස්වීමකම ඔහු මූලාසනය දැරිය යුතු ය. පළාත් අධිකාරියේ යම් රැස්වීමකට, සභාපතිවරයා සහභාගී නොවන අවස්ථාවක පැමිණ සිටින සාමාජිකයන් විසින් තමන් අතුරෙන් තෝරා පත් කර ගන්නා යම් සාමාජිකයකු ඒ මූලසනය දැරිය යුතු ය. පළාත් අධිකාරියේ කටයුතු කිරීම.

ii. අධ්‍යක්ෂ මණ්ඩලය අවම වශයෙන් මසකට වරක් වත් රැස්විය යුතු ය. රැස්වීම අවශ්‍ය යයි පළාත් අධිකාරියේ සභාපතිවරයා සලකන ඕනෑම අවස්ථාවක දී හෝ අධිකාරියේ සාමාජිකයන් තුන්දෙනෙකු විසින් ලිඛිත ඉල්ලීමක් කර ඇති අවස්ථාවක දී හෝ පළාත් අධිකාරියේ රැස්වීමක් සභාපතිවරයා විසින් කැඳවිය යුතු ය.

iii. මෙම ප්‍රඥප්තියේ විධි විධානවලට යටත් ව පළාත් අධිකාරියේ රැස්වීම් හා ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යා යුතු ආකාරය සම්බන්ධව කාර්ය විධානයකට අදාළව පළාත් අධිකාරිය විසින් රීති සෑදිය හැකි ය.

17. i. පළාත් අධිකාරියේ මුද්‍රාව පළාත් අධිකාරියේ සභාපතිවරයා භාරයේ තිබිය යුතු ය. පළාත් අධිකාරියේ මුද්‍රාව.

ii. පළාත් අධිකාරියේ මුද්‍රාව පළාත් අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන ආකාරයට වෙනස් කර ගත හැකි ය.

iii. පළාත් අධිකාරියේ මුද්‍රාව පළාත් අධිකාරියේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිට දී හැර කිසිම ලේඛනයකට හෝ සාධන පත්‍රයකට හෝ නොතැබිය යුතු ය. ඒ සාමාජිකයන් දෙදෙනාගෙන් එක් සාමාජිකයකු පළාත් අධිකාරියේ සභාපතිවරයා විය යුතු ය. තමන් ඉදිරිපිට දී මුද්‍රාව තැබූ බවට සාක්ෂියක් වශයෙන් ඒ සාමාජිකයින් දෙදෙනාම ඒ ලේඛනයට හෝ සාධන පත්‍රයට හෝ අත්සන් තැබිය යුතු ය.

## II වන කොටස

### පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරියේ බලතල හා කාර්යයන්

18. පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරියට පහත සඳහන් බලතල හා කාර්යයන් පැවරේ. පළාත් අධිකාරියේ බලතල හා කාර්යයන්.

i. වයඹ පළාත ඇතුළත මහජන මගී ප්‍රවාහන අවශ්‍යතාවලට සරිලන මනා තත්ත්වයක බස් සේවයක් පවතින්නේ ද යන්න පිළිබඳව සොයා බැලීම සහ ධාවන කාලසටහන් පිළියෙල කිරීම හා ධාවකයින් එම කාලසටහන් පිළිපදින බවට වගබලා ගැනීමට පියවර ගැනීම හා වයඹ පළාත තුළ මගී ප්‍රවාහනය සඳහා බස් රථ යෙදිය යුතු මාර්ග අනුමත කිරීම, වර්ග කිරීම, හා බස් මාර්ගවල නැවතුම්පළවල් ඉදි කිරීම තීරණය කිරීම. මගී හා භාණ්ඩ ප්‍රවාහනය සේවා සම්බන්ධ බලතල.

ii. *(අ)* පළාත තුළ මගී ප්‍රවාහන අවශ්‍යතාවය සපුරාලීම සඳහා, බස්රථ පාවිච්චි කිරීමට බලය දෙන මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම, ඒ අවසර පත් අළුත් කිරීම හෝ සංශෝධනය කිරීම, අවලංගු කිරීම හා කාලය දීර්ඝ කිරීම සහ අයිතිය විධිමත් කිරීම, එම අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා ගාස්තු නියම කිරීම. මගී හා භාණ්ඩ සේවා අවසර පත්‍ර නිකුත් කිරීම.

*(ආ)* මගී ප්‍රවාහනය සඳහා බස්රථ පාවිච්චි කිරීමට බලය දෙන මගී සේවා අවසර පත් නිකුත් කරනු ලබන්නේ යම් කොන්දේසිවලට යටත්ව ද ඒ කොන්දේසි පිළිපදින බවට වග බලා ගැනීම හා ඒවා ක්‍රියාත්මක කිරීම.

*(ඇ)* පළාත තුළ මගී අවශ්‍යතාවය සපුරාලීම, විධිමත් කිරීම හා භාණ්ඩ ප්‍රවාහන සේවා විධිමත් කිරීම සඳහා අධිකාරී පත්‍රයක් නිකුත් කිරීම, අළුත් කිරීම,සංශෝධනය කිරීම, අවලංගු කිරීම, කාලය දීර්ඝ කිරීම සහ අයිතිය විධිමත් කිරීම, එම අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා ගාස්තු නියම කිරීම.

මගී හා භාණ්ඩ ප්‍රවාහන සේවා සඳහා යොදා ගන්නා වාහනවල යෝග්‍යතාවය.

iii. පළාත තුළ මගී හා /හෝ භාණ්ඩ ප්‍රවාහන සේවා අවසර ලාභියෙකු විසින් මගී ප්‍රවාහන සේවයේ හෝ භාණ්ඩ ප්‍රවාහන සේවයේ යොදවනු ලබන මෝටර් වාහනයක අවසරපත්‍රලාභියා විසින් පවත්වාගෙන යායුතු ගුණාත්මකභාවය සහ යෝග්‍යතාවය පිළිබඳ වෙනත් නීතියක් මගින් නියම කර නොමැති මගී හා භාණ්ඩ ප්‍රවාහනයට අත්‍යාවශ්‍ය වන ප්‍රමිති අමාත්‍යවරයා වෙත නිර්දේශ කිරීම.

තොරතුරු සැපයීම.

iv. මෙම ප්‍රඥප්තිය යටතේ යම් අරමුණක් සඳහා අවශ්‍ය වන්නා වූ තොරතුරු හා වාර්තා අධිකාරිය වෙත සපයන ලෙස මෙම ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ හෝ මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් ලබා ඇති තැනැත්තෙකුට හෝ භාණ්ඩ ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් ලබා ඇති තැනැත්තෙකුට නියම කිරීම.

පාසැල් ළමුන් ප්‍රවාහනය කිරීම

v. පළාත තුළ ගාස්තුවක්, ප්‍රතිලාභයක් හෝ ත්‍යාගයක් සඳහා පාසැල්, විශ්වවිද්‍යාල සහ වෙනත් අධ්‍යාපන ආයතනවල ශිෂ්‍යයන් ප්‍රවාහනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම සහ සංශෝධනය කිරීම, අවලංගු කිරීම හා කාලය දීර්ඝ කිරීම, අයිතිය විධිමත් කිරීම, අනුග්‍රාහක ගාස්තු මත ප්‍රවාහන සේවා සැලසීම.

කාර්යාල සේවක හා කර්මාන්ත ශාලා සේවකයින් ප්‍රවාහනය කිරීම.

vi. පළාත තුළ ගාස්තුවක්, ප්‍රතිලාභයක් හෝ ත්‍යාගයක් සඳහා බස්රථවලින් හෝ වෑන් රථවලින් කරනු ලබන කාර්යාල සේවක හා කර්මාන්ත ශාලා සේවක ප්‍රවාහනය කිරීමේ සේවා විධිමත් කිරීම, එකී මගී ප්‍රවාහන සේවා පවත්වාගෙන යාම සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම. සංශෝධනය කිරීම, අවලංගු කිරීම හා කාලය දීර්ඝ කිරීම, අයිතිය විධිමත් කිරීම, එම අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා ගාස්තු නියම කිරීම.

ත්‍රී රෝද රථ (ට්‍රයිසිකල්) හා කුලී රථ මගින් මගීන් ප්‍රවාහනය කිරීම.

vii. පළාත් තුළ ගාස්තුවක් අය කර, ප්‍රතිලාභයක් මත හෝ ගාස්තුවක් අය නොකර ත්‍රීරෝද රථ (ට්‍රයිසිකල්) වලින් හෝ කුලී රථවලින් කරනු ලබන මගීන් ප්‍රවාහනය කිරීමේ සේවා විධිමත් කිරීම සඳහා එකී මගී ප්‍රවාහන සේවා පවත්වාගෙන යාම සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම,සංශෝධනය කිරීම,අවලංගු කිරීම හා කාලය දීර්ඝ කිරීම, අයිතිය විධිමත් කිරීම, එම අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා ගාස්තු නියම කිරීම.

අන්තර් පළාත් ප්‍රවාහන සේවා.

viii. වෙනත් පළාතකින් වයඹ පළාතට පිවිස, වයඹ පළාත තුළ හෝ වයඹ පළාත හරහා ගාස්තුවක්, ත්‍යාගයක්, ප්‍රතිලාභයක් හෝ වෙන් වෙන් ගාස්තු මත මගී හෝ භාණ්ඩ ප්‍රවාහනයේ යෙදෙන මෝටර් වාහනවලින් සේවා ගාස්තු අය කිරීම, පාලනය කිරීම හා විධිමත් කිරීම.

ix. ජාතික ගමනා ගමන කොමිෂන් සභාව හෝ වෙනත් ආයතන විසින් බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධව නිර්දේශ ඉල්ලා සිටින අවස්ථාවක දී, උචිත පරිදි නිර්දේශ ලබා දීම සහ මෙම අධිකාරියේ නිර්දේශයකින් තොරව නිකුත් කර ඇති අවසර පත්‍රයක් යටතේ ධාවනය වන බස් රථ සඳහා පිවිසුම් අවසරය ලබා නොදීම හා ඒ හා සම්බන්ධ නෛතික ක්‍රියා මාර්ග ගැනීම.

නව ව්‍යාපෘති හඳුන්වා දීම.

x. වයඹ පළාත තුළ මගී ප්‍රවාහන සේවාවේ වර්ධනය හා ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම වෙනුවෙන් මගී ජනතාවට මෙන් ම ආයෝජකයින්ගේ සංවර්ධනය උදෙසා නව ව්‍යාපෘති හඳුන්වා දීම, ක්‍රියාවට නැංවීම සහ විෂයභාර අමාත්‍යවරයාගේ හා විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකගත්වය හා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව මේ වෙනුවෙන් අනුකමිටු පිහිටුවීම.

කාල සටහන් නියම කිරීම.

xi. පළාත ඇතුළත සියලු පොදු මගී ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම බස් රථ ධාවනය සඳහා පොදු, ඒකාබද්ධ හෝ අධිකාරිය විසින් උචිත යැයි තීරණය කරනු ලබන, විද්‍යාත්මක කාල සටහන් නියම කිරීම, එම කාල සටහන් අනුව ධාවන කටයුතු කළ යුතු බවට සියලු ධාවකයන්ට නියම කිරීම හා

| | | |
|---|---|---|
| | උල්ලංඝනය කරන්නන් සම්බන්ධයෙන් ස්ථානීය සේවා ගාස්තු නියම කිරීම හා නෛතික ක්‍රියා මාර්ග ගැනීම. | |
| xii. | අධිකාරිය විසින් නිකුත් කරන ලැබූ අවසර පත්‍රලාභී බස්රථයක ඇතුලත සහ පිටත ප්‍රදර්ශනය කළ යුතු ගමනාරම්භ හා ගමනාන්ත නාම පුවරු සලකුණු හා සංකේත ත්‍රෛභාෂාවෙන්ම යෙදීම. | බස්රථ ගමනාන්ත නාම පුවරු ආදිය. |
| xiii. | අධිකාරිය විසින් නිකුත් කරනු ලබන අවසරපත්‍රයක් හෝ වෙනත් බලපත්‍රයක් යටතේ මගී ප්‍රවාහනය හෝ භාණ්ඩ ප්‍රවාහනයේ යෙදෙන මෝටර් වාහනවල රියදුරන් කොන්දොස්තරවරුන් සහ රිය සහායකයින් ලියාපදිංචි කිරීම, හැඳුනුම්පත් නිකුත් කිරීම, ගාස්තු අය කිරීම සහ ලියාපදිංචි කරන ලද රියදුරන්, කොන්දොස්තරවරුන් සහ රිය සහායකයින්ගේ ලියාපදිංචිය අවලංගු කිරීම, අළුත් කිරීම, අත්හිටුවීම. | රියදුරන් කොන්දෙස්තර රිය සහායකයින් ලියාපදිංචි කිරීම. |
| xiv. | පළාත ඇතුලත මගී හෝ භාණ්ඩ ප්‍රවාහනයට සම්බන්ධ මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් වන ක්‍රියාවන් සෙවීම, වැලැක්වීම සහ ඒවාට විරුද්ධව ක්‍රියා කිරීම අරමුණු කොට හදිසි පරීක්ෂණ කණ්ඩායම් ස්ථාපනය කිරීම හෝ ස්ථාපනය කරවීම හෝ එකී කණ්ඩායම්වල බලතල සහ කාර්යයන් නියම කිරීම. | හදිසි පරීක්ෂණ කණ්ඩායම් සහ භාණ්ඩ ප්‍රවාහනය. |
| xv. | කුලී මෝටර් රථ හෝ භාණ්ඩ ප්‍රවාහනය කෙරෙන වාහන නැවතුම් පොලවල් පිහිටුවීම, කළමණාකරණය, සංවර්ධනය කිරීම, වෙනස් කිරීම, වසා දැමීම සහ නීත්‍යානුකූලව අත්පත් කර ගැනීම. | කුලී මෝටර් රථ සහ භාණ්ඩ ප්‍රවාහනය කරන රථ නැවතුම් ස්ථාන. |
| xvi. | පළාත තුළ වෙන් වෙන් ගාස්තු මත ප්‍රවාහන සේවාවන් පවත්වා ගෙන යා හැකි මාර්ගයන් හඳුනා ගැනීම, වර්ග කිරීම, සහ එකී එක් එක් මාර්ගයන්හි මගී ප්‍රවාහන හෝ භාණ්ඩ ප්‍රවාහන සේවා කටයුතු සඳහා පාවිච්චි කල යුතු බස්රථ සහ වෙනත් මෝටර් වාහන වර්ගය හා ප්‍රමිතිය නියම කිරීම. | මගී ප්‍රවාහන සේවා මාර්ග හඳුනා ගැනීම හා ඒවායේ ධාවනය කළ යුතු මෝටර් වාහන නියම කිරීම. |
| xvii. | අධිකාරියේ අරමුණු පරමාර්ථ සහ කාර්යයන් ඉටු කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන සහ වෙනත් යම් නීතියක නියමයන්ට යටත්ව ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තෙකු හෝ ආයතනයක් සමග ගිවිසුම් සහ කොන්ත්‍රාත්වලට එළඹීම සහ එකී අරමුණු පරමාර්ථ සහ කාර්යයන් ඉටුකර ගැනීම සඳහා වෙනත් ආයතන සමග සම්බන්ධ වීම. | ගිවිසුම් හා කොන්ත්‍රාත් |
| xviii. | මුදල්මය වශයෙන් හෝ ද්‍රව්‍යමය වශයෙන් හෝ අන්‍යාකාරයෙන් හෝ ප්‍රදාන, පරිත්‍යාග, ආධාර හෝ සහනාධාර පිළිගැනීම සහ මෙම ප්‍රඥප්තියේ ප්‍රතිපාදනයන්ට යටත් ව අධිකාරියේ අරමුණු අරභයා ඒවා යොදා ගැනීම. | පරිත්‍යාග |
| xix. | රියදුරන්, කොන්දොස්තරවරුන් සහ රිය සහායකයන් පුහුණු කිරීම සඳහා රියදුරු පුහුණු පාසැල් ආරම්භ කිරීම, පුහුණු පාඨමාලා පැවැත්වීම. | රියදුරු කොන්දෙස්තර හා රිය සහයකයින් පුහුණු කිරීම. |
| 18.1 | අධිකාරියට පළාත තුළ පිහිටි බස්රථගාල් හා මාර්ගස්ථ නැවතුම් ස්ථාන සම්බන්ධයෙන් පහත සඳහන් බලතල ක්‍රියාත්මක කල හැක. | පළාතේ බස් නැවතුම්පලවල් පරිපාලනය හා කළමණාකරණය |

අ. බස්රථ ගාල් හා මාර්ගස්ථ නැවතුම් ස්ථාන පිහිටු වීම, නඩත්තු කිරීම, වසා දැමීම, කළමණාකරණය, සංවර්ධනය කිරීම, වෙනස් කිරීම, නීත්‍යානුකූලව අත්පත් කර ගැනීම.

වෙනත් බලතල ක්‍රියාත්මක කිරීම.

ආ. බස් නැවතුම් පොලවල බස්රථ ධාවන කළමනාකරණ කටයුතු, කාලසටහන් නියම කිරීම, මෙන්ම එකී කළමනාකරණ කටයුතු සඳහා අවශ්‍ය අධිකාරියේ කාර්ය මණ්ඩල යෙදවීම සහ ඔවුන්ගේ බලතල, කාර්යයන් හා වගකීම නියම කිරීම සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීම, බස් නැවතුම්පොළවල අධිකාරියේ කාර්ය මණ්ඩලය විසින් පවත්වාගෙන යායුතු වාර්තා සහ ලිපි ලේඛන හා ඒවායේ සටහන් කල යුතු තොරතුරු නියම කිරීම.

ඇ. අධිකාරිය විසින් පරිපාලනය හා කළමනාකරණය කරගෙන යනු ලබන බස් නැවතුම්පොලවල පරිපාලනය හා ප්‍රවාහන සේවා කටයුතුවලට බාහිර පාර්ශ්වයන් සම්බන්ධ කර ගැනීම සම්බන්ධයෙන් තීරණ ගැනීම සහ නිර්ණායක තීරණය කිරීමේ බලය අධිකාරිය සතු වන්නේය.

දේපල අත්පත් කිරීම/බැහැර කිරීම.

ඈ. විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියට යටත් ව අධිකාරියේ කාර්යයන් සඳහා යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්පත් කර ගැනීම, බැහැර කිරීම, බද්දට හෝ කුලියට දීම /ගැනීම.

වෙනත් බලතල ක්‍රියාත්මක කිරීම.

ඉ. මෙම ප්‍රඥප්තිය යටතේ අධිකාරියේ බලතල කාර්ය සහ කර්තව්‍ය නිසි පරිදි ඉටු කිරීම සහ කරවීම සඳහා අවශ්‍ය යැයි අධිකාරියට හැගෙන වෙනත් බලතල ක්‍රියාත්මක කිරීම.

## **III** වැනි කොටස

### පළාත් ප්‍රවාහන සේවා අධිකාරියේ කාර්ය මණ්ඩලය

පළාත් අධිකාරියේ සාමාන්‍යාධිකාරි-වරයා

19\. i. පළාත් ප්‍රවාහන සේවා අධිකාරිය විසින් අමාත්‍යවරයාගේ ලිඛිත අනුමැතිය ඇතිව අධිකාරිය සඳහා සාමාන්‍යාධිකාරිවරයකු පත් කරනු ලැබිය යුතු ය.

ii. පළාත් ප්‍රවාහන සේවා අධිකාරියේ එදිනෙදා වැඩ කටයුතු මෙහෙයවීම ද, අධිකාරියේ සේවා නියුක්තයන් පිළිබඳ පරිපාලනමය පාලනය ද, අධිකාරියේ සාමාන්‍ය විධානයට හා පරිපාලනයට යටත් ව සාමාන්‍යාධිකාරිවරයාට බාර කරනු ලැබිය යුතු ය.

iii. මෙම ප්‍රඥප්තියෙන් අධිකාරියට පැවරෙන යම් බලතල හා කර්තව්‍යයන් අතුරෙන් කාර්යක්ෂම පරිපාලනයට අවශ්‍ය යැයි අධිකාරිය අදහස් කරන බලතල හා කර්තව්‍යයන් පළාත් ප්‍රවාහන සේවා අධිකාරිය විසින් වරින්වර සාමාන්‍යාධිකාරීවරයාට පවරා දිය හැක. සාමාන්‍යාධිකාරීවරයා එවැනි බලතල පළාත් ප්‍රවාහන සේවා අධිකාරියේ මග පෙන්වීම හා පාලනයට යටත් ව ක්‍රියාත්මක කල යුතු ය.

iv. තමාගේ බලතල කර්තව්‍ය හෝ කාර්ය අතුරින් පළාත් අධිකාරියේ වෙනත් යම් සේවා නියුක්තියකුට පැවරීම අවශ්‍ය යයි සාමාන්‍යාධිකාරිවරයා කලින් කල සලකන, බලතල කර්තව්‍ය හෝ කාර්ය පළාත් අධිකාරියේ ලිඛිත අනුමැතිය ඇතිව සාමාන්‍යාධිකාරිවරයා විසින් ලිඛිතව ඒ සේවා නියුක්තිකයාට පැවරිය හැකි අතර,එවැනි යම් බලතල, කර්තව්‍ය හෝ කාර්ය එසේ පවරනු ලැබූ යම් සේවා නියුක්තයකු විසින් සාමාන්‍යාධිකාරිවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත් ව ඒවා ක්‍රියාත්මක කල යුතු ය.

v. අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව සාමාන්‍යාධිකාරීවරයා ධුරයෙන් ඉවත් කරනු නොලැබිය යුතු ය.

පළාත් අධිකාරියේ කාර්ය මණ්ඩලයේ පත්වීම් ආදිය

20\. i. පළාත් ප්‍රවාහන සේවා අධිකාරිය විසින්,

*(අ)* පළාත් ප්‍රවාහන සේවා අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන කාර්ය මණ්ඩලයක් පත් කිරීම සහ එම කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් විනය පාලනය පවත්වාගෙන යාම.

(ආ) ඒ කාර්ය මණ්ඩලයේ වේතන හෝ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම.

(ඇ) ඒ කාර්ය මණ්ඩලයේ යහපත සඳහා අර්ථසාධක අරමුදල් හෝ යෝජනා ක්‍රම පිහිටුවීම හා විධිමත් කිරීම සහ එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවීම කළ හැකිය.

ii. වයඹ පළාත් රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ තාවකාලික හෝ ස්ථිර හෝ තනතුරකට පත් කිරීමට අවශ්‍ය යයි අධිකාරිය තීරණය කරනු ලබන අවස්ථාවකදී, එකී නිලධාරියාගේ කැමැත්තද / අදාල පත්වීම් බලධාරියාගේ සහ , වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂමේ අනුමැතියද ඇතිව පත් කළ හැකිය.

iii. පළාත් අධිකාරියේ ඉල්ලීම පිට රජයේ සේවයේ යම් නිලධාරියකු එම නිලධාරියාගේද, එම නිලධාරියා සේවයේ නියුක්ත කරවනු ලැබ සිටියේ යම් අමාත්‍යාංශයක් විසින්ද නැතහොත් යම් අමාත්‍යාංශයක් යටතේද එම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේද රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේද කැමැත්ත ඇතිව, පළාත් අධිකාරිය විසින් එවැනිම කැමැත්ත ඇතිව, නිශ්චය කරනු ලබන කාලයක් සඳහා පළාත් අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකිය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකිය.

iv. නිශ්චිත කාලසීමාවක් රජයට හෝ පළාත් සභාවකට හෝ සේවය කිරීමට එකග වෙමින් රජය හෝ පළාත් සභාවක් සමග හෝ ගිවිසුමකට එළඹ සිටින යම් තැනැත්තකු, පළාත් අධිකාරිය විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා පළාත් අධිකාරියට සේවය කරන යම් සේවා කාලයක් රජයේ හෝ පළාත් සභාවේ එකඟත්වයට යටත්ව, ඒ ගිවිසුමේ බැඳීම ඉටු කිරීමේ කාර්යය සඳහා රජයට හෝ එම පළාත් සභාවට හෝ කරනු ලබන සේවයක් ලෙස සැලකිය යුතු ය.

## IV වැනි කොටස

## මුදල්

21. i. පළාත් ප්‍රවාහන සේවා අධිකාරියට අධිකාරියේම අරමුදලක් තිබිය යුතු ය. *පළාත් අධිකාරියේ අරමුදල.*

ii. පළාත් ප්‍රවාහන සේවා අධිකාරියේ අරමුදලට පහත සඳහන් මුදල් ගෙවිය යුතු ය.

(අ) මගී හා /හෝ භාණ්ඩ සේවා අවසරපත්‍ර නිකුත් කිරීම සහ අළුත් කිරීම මත අය කරනු ලබන මුදල් හා ස්වකීය බලතල කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීමේදී හා ඉටු කිරීමේදී පළාත් අධිකාරියට ලැබෙන සියළු මුදල් ප්‍රමාණයත්,

(ආ) වයඹ පළාතේ, පළාත් සභාවෙන් ලැබෙන ආධාර මුදල්ද ඇතුළුව අධිකාරියේ බැරට උපචිත සියළු මුදල්.

iii. මෙම මුදල නිසි පරිදි පරිපාලනය කිරීම හා ගිණුම් ගත කිරීම සාමාන්‍යාධිකාරීවරයා සතු වගකීමකි. මෙම මුදල නිසි පරිදි පරිපාලනය කිරීම හා ගිණුම් ගත කිරීම සඳහා බලය කාර්ය මණ්ඩලයට පැවරීමට සාමාන්‍යධිකාරීවරයාට හැකියාව පවතී.

iv. මෙම ප්‍රඥප්තිය සහ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පළාත් අධිකාරියේ කටයුතු කළමණාකරණය කිරීම අධිකාරියේ සාමාජිකයන්ට හා අධිකාරියේ සේවා නියුක්තයන්ට පාරිශ්‍රමික ගෙවීම් පළාත් අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් දරනු ලබන යම් වියදම් ගෙවීමේ කාර්ය සඳහා සහ කලින් කල අධිකාරිය විසින් බලය දෙනු ලැබිය හැකි වෙනත් කාර්ය සඳහා පළාත් අධිකාරිය විසින් අධිකාරියේ අරමුදල් උපයෝගී කරගත හැක.

22. මෙම ප්‍රඥප්තිය යටතේ, පළාත් ප්‍රවාහන සේවා අධිකාරියේ කාර්ය ඉටු කිරීමේදී සිය වගකීම ඉටු කිරීම සඳහා අධිකාරියට අවශ්‍ය වනු ලබන මුදල්, පළාත් සභාවේ මුදල්, විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව හෝ ඔහු විසින් දෙන ලද පොදු අවසරයකට නියමයන්ට අනුකූලව බැංකු අයිරාවක් මගින් හෝ අන්‍යාකාරයකින් හෝ අධිකාරිය විසින් ණයට ගත හැකිය. *අධිකාරියේ ණය ගැනීමේ බලතල.*

පළාත් අධිකාරියේ ගිණුම්.

23. i. පළාත් ප්‍රවාහන සේවා අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

ii. පළාත් අධිකාරියේ ආදායම් හා වියදම්, වත්කම් හා බැරකම් සහ වෙනත් සියළු ගණුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තැබීමට අධිකාරිය විසින් සලස්වනු ලැබිය යුතු ය.

iii. පළාත් අධිකාරිය එහි ගිණුම් වාර්ෂිකව විගණනය කරවිය යුතු මුදල්, විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන සුදුසුකම්ලත් විගණනවරයෙක් මගින් එම විගණනය කරවා ගත යුතු ය.

iv. පළාත් අධිකාරිය විසින් ඉටු කරන ලද කාර්යයන් පිළිබද වාර්ෂික වාර්තාවක් අධිකාරිය විසින් සකස් කළ යුතු ය.

v. පළාත් අධිකාරියේ වාර්ෂික වාර්තාව සහ විගණන වාර්තාව අමාත්‍යවරයා විසින් මුදල් වර්ෂය ඉකුත් වී මාස 09 ක් ගතවීමට පෙර පළාත් සභාවෙහි සභාගත කළ යුතු ය.

vi. 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 වගන්තිය පරිදි පළාත් සභා අරමුදල් විගණනය කිරීම හා ගිණුම් සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි ව්‍යවස්ථාව අදාල කර ගත යුතු ය.

## V වැනි කොටස

### පොදු විධිවිධාන

නියෝග ලබාදීමට අමාත්‍යවරයාට බලය ඇති බව.

24. i. පළාත් අධිකාරියේ බලතල, කාර්යයන් හා කටයුතු කළමනාකරණය කිරීම සහ මගී හා ප්‍රවාහන සේවයේ යෙදෙන සියළු සේවකයන්ට අදාල අවම වැටුප් නිවාඩු සහ සේවක වරප්‍රසාද පිළිබද නියෝග සැදීමට මේ ප්‍රඥප්තියෙන් බලය දෙනු ලැබූ හෝ නියම කරනු ලැබූ සියලු කරුණු හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සැදිය හැකිය.

ii. අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පල කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ එහිලා නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පසුව එළඹෙන දිනයක ක්‍රියාත්මක විය යුතු ය.

iii. අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම *ගැසට් පත්‍රයේ* පල කරනු ලැබීමෙන් පසු, හැකිතාක් ඉක්මනින් අනුමැතිය සඳහා වයඹ පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක්ම එහි අනුමැතියේ දින සිට පරිච්ජින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුදු එය යටතේ කලින් කරන ලද කිසිවක් බලරහිත නොවිය යුතු ය.

iv. අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියෝගයක් එසේ පරිච්ඡින්න වූ ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනය *ගැසට් පත්‍රයෙහි* පල කරනු ලැබිය යුතු ය.

මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය අවලංගු කිරීම.

25. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට වයඹ පළාතේ පළාත් සභාවේ 1995 අංක 04 දරන බස්රථ මගී ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය අවලංගු වන්නේය.

## Vl වැනි කොටස

### වරදවල් හා දඩුවම්

වැරදි.

26. i. අධිකාරිය විසින් හෝ වෙනත් කිනම් හෝ ආයතනයක් මගින් නිකුත් කරන ලද මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක අධිකාරිය යටතේ මගී ප්‍රවාහනයේ යෙදෙන බස් රථයක ගමන් කරන,

*(අ)* තමාගෙන් අයවිය යුතු ගාස්තු ගෙවීම පැහැර හරින,

*(ආ)* ස්වකීය ගමනාන්තයට පැමිණි විට බස්රථයෙන් බැසීම හිතාමතාම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින,

(ඈ) කිසියම් තැනැත්තෙකුට පීඩාකාරී හෝ අපහාස වන කිසියම් ආකාරයේ යම් අසභ්‍ය, අශෝභන හෝ ආවේගශීලී භාෂාවක් හෝ අභිනයක් හෝ හැසිරීමක් භාවිතා කරන හෝ සිදුකරන යම් මගියෙකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සිදු කරනු ලබන අතර, එම වරද සිදු කරන මගියාගෙන් අයවිය යුතු ගාස්තුව මෙන් දෙගුණයක් හා රු. 1000.00 ක ස්ථානීය දඩයක් (සේවා ගාස්තුවක්) අධිකාරිය විසින් බලය දෙනු ලබන අධිකාරියේ යම් නිලධරයකුට ගෙවිය යුතු ය.

ii. (අ) අධිකාරිය විසින් හෝ වෙනත් ආයතනයක් විසින් නිකුත් කරන ලද යම් අවසර පත්‍රයක අධිකාරිය යටතේ ධාවනය කරන බස් රථයක ගමන් බලපත්‍රයක් හෝ අධිකාරිය විසින් නිකුත් කරනු ලැබූ යම් අධිකාරියක් නොමැතිව ගමන් කරන,

(ආ) ඒ ගමන් වාරය සඳහා තමාට නිකුත් කළ ප්‍රවේශ පත්‍රය ගමන මුළුල්ලේම අවසානය දක්වා තමා සතුව රඳවා නොගන්නා ; හෝ

(ඇ) ඒ බස්රථයේ කොන්දොස්තරවරයා විසින් හෝ තත්කාලය සඳහා අධිකාරිය විසින් බලය දෙන ලද වෙනත් තැනැත්තෙකු විසින් ඉල්ලා සිටි විට, ඒ ප්‍රවේශ පත්‍රය පෙන්වීම හෝ භාරදීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන මගියෙකු, මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සිදු කරන අතර, එම වරද සිදු කරනු ලබන මගියාගෙන් අයවිය යුතු ගාස්තුව මෙන් දෙගුණයක් හා රු. 1000.00 ක ස්ථානීය දඩයක් (සේවා ගාස්තුවක්) අධිකාරිය විසින් බලය දෙනු ලබන අධිකාරියේ යම් නිලධරයකුට ගෙවිය යුතු ය.

iii. (අ) අධිකාරියේ අවසරය මත හෝ ඒ යටතේ නිකුත් කරන ලද යම් ප්‍රවේශ පත්‍රයක් වංචා සහගත ලෙස පාවිච්චි කරනු ලබන හෝ ඒ සඳහා වෙනත් තැනැත්තෙකුට ඉඩ දෙනු ලබන ඕනෑම තැනැත්තෙකු,

(ආ) එවැනි යම් ප්‍රවේශ පත්‍රයක් වංචා සහගත ලෙස අනුකරණය කරන ස්වභාවය වෙනස් කරන, විකෘති කරන හෝ විනාශ කරනු ලබන ඕනෑම තැනැත්තෙකු,

(ඇ) එවැනි යම් ප්‍රවේශ පත්‍රයක් අධිකාරියේ අවසරය නොමැතිව විකුණන, සපයන හෝ බෙදාහරින හෝ අළෙවිය සඳහා ඉදිරිපත් කරනු ලබන ඕනෑම තැනැත්තෙකු,

(ඈ) අවසරය නොමැතිව එවැනි ප්‍රවේශ පත්‍රයක් ලෙස මුද්‍රණය කරන ලදැයි අදහස් කරන හෝ පාවිච්චි කරන ලද යම් ප්‍රවේශ පත්‍රයක් මුද්‍රණය කරන ඕනෑම තැනැත්තෙකු,

(ඉ) අධිකාරියේ අවසරය මත හෝ යටතේ නිකුත් කරන ලදැයි අදහස් කරන,

(ඊ) බස්රථයේ වලංගු ටිකට් පතක් සහිතව ගමන් කරන මගියෙකුට පීඩාකාරී හෝ අපහාස වන කිසියම් ආකාරයේ යම් අසභ්‍ය, අශෝභන හෝ ආවේගශීලී භාෂාවක් හෝ අභිනයක් හෝ හැසිරීමක් භාවිතා කරන හෝ සිදුකරන එකී බස් රථයේ රියැදුරකු හෝ කොන්දොස්තරවරයකු වන තැනැත්තෙකු,

(උ) මගීන් ප්‍රවාහනය කරනු ලබන බස් රථයක වූ අභ්‍යන්තරික ශබ්ද ජනක යන්ත්‍ර හෝ උපකරණවල ශබ්ද මට්ටම අධිකාරිය විසින් නියම කරනු ලබන ශබ්ද මට්ටම ඉක්මවනු ලබන අවස්ථාවක, එකී බස්රථයේ අවසර පත්‍රය දරන්නෙකු, රියැදුරකු හෝ කොන්දොස්තරවරයකු,

(ඌ) රියැදුරකු හෝ කොන්දොස්තරවරයකු හෝ රිය සහායකයකු ලෙස නිසි පරිදි අධිකාරියේ ලියාපදිංචි නොවී හෝ එසේ ලියාපදිංචි වුවද, එම ලියාපදිංචිය අවලංගුව පවතින අවස්ථාවක අධිකාරිය විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් යටතේ මගී ප්‍රවාහනයේ හෝ භාණ්ඩ ප්‍රවාහනයේ යෙදෙන ඕනෑම තැනැත්තෙකු,

(එ) අධිකාරියට අයත් බස් නැවතුම්පලක පිහිටි හෝ වෙනත් ස්ථානයක පිහිටි ගොඩනැගිල්ලක හෝ මගී ආවරණයක හෝ අධිකාරියේ අවසරයකින් තොරව දැන්වීම් ප්‍රදර්ශනය කරන දැන්වීම් අලවන හෝ අකුරු, පාඨ, වචන ලිවීමෙන් හෝ රූප හෝ ඡායාරූප හෝ වෙනත් සළකුණු ඇඳීමෙන් දැන්වීම් ප්‍රදර්ශනය කරන හා ඕනෑම අයුරකින් හිතාමතාම අපවිත්‍ර කරනු ලබන තැනැත්තෙකු,

මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දහසකට නොඅඩු සහ රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දෙකටම හෝ ඔහු / ඇය යටත් විය යුතු ය.

iv. ඉහත (i), (ii), (iii) උපවගන්තිය යටතේ සඳහන් අවස්ථාවල දී හැර මේ ප්‍රඥප්තියේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද නියෝගවලට එකඟව ක්‍රියා කිරීමට අපොහොසත් වන හෝ පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් එක්දහස් පන්සියයකට නොඅඩු සහ රුපියල් දෙදහස් පන්සියයකට නොවැඩි දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ දඩය යන දෙකටම හෝ යටත් විය යුතු ය.

v. මේ ප්‍රඥප්ති යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග යටතේ යම් වරදක් සිදු කිරීමට තැත් කරන යම් තැනැත්තෙකු එම වරදට වරදකරු වන අතර, රු. 2500.00 ක් නොඉක්මවන දඩයකට හෝ මාස 6 ක ලිහිල් බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.

වරදකරුවන් අත්අඩංගුවට ගැනීම.

vi. මෙම ප්‍රඥප්තියේ ඉහත i, ii, iii යන උපවගන්ති යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කරනු ලබන ඕනෑම තැනැත්තෙකු ඕනෑම පොලිස් නිලධරයකු විසින් නීත්‍යානුකූල ආකාරයට අත්අඩංගුවට ගනු ලැබිය හැකි අතර, එසේ අත්අඩංගුවට ගනු ලැබූ තැනැත්තා වහාම නීතියට අනුව ක්‍රියා කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියට පැමිණවීමට ක්‍රියා කළ යුතු ය.

සාවද්‍ය වාර්තා ඉදිරිපත් කිරීම.

27. දැනුවත්ව ව්‍යාජ හෝ සාවද්‍ය විස්තර ඇතුළත් යම් වාර්තාවක් ලිඛිත තොරතුරක් හෝ ලිඛිත කරුණු පැහැදිලි කිරීමක් ඉදිරිපත් කරන යම් තැනැත්තෙකු මේ ප්‍රඥප්තිය යටතේ වරදක් කළා වන අතර, ඒ පිළිබඳව මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුද්දකට නොවැඩි කාලයකට සිර දඬුවමකට හෝ එකී දඩය හා සිර දඬුවම් යන දෙකටම හෝ යටත් වන්නේ ය.

ස්ථානීය ගාස්තු.

28. මේ ප්‍රඥප්තියේ යම් විධානයක් හෝ ඒ යටතේ පනවන ලද නිකුත් කරන ලද හෝ දෙන ලද යම් නියෝගයක්, නියමයක්, විධානයක් හෝ අවශ්‍යතාවයක් ස්ථානීය දඩ ගෙවීම පැහැර හැරීමක් සිදු කරන, උල්ලංඝනය කරන හෝ ක්‍රියාත්මක නොකරන යම් තැනැත්තෙකු මේ ප්‍රඥප්තිය යටතේ වරදක් කළා වන අතර, ඒ පිළිබඳව මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහස් පන්සියයකට නොවැඩි දඩයකට හෝ අවුරුද්දකට නොවැඩි කාලයකට සිර දඬුවමකට හෝ එකී දඩය හා සිර දඬුවම් යන දෙකටම හෝ යටත් වන්නේ ය.

පුද්ගල මණ්ඩල විසින් සිදු කරනු ලබන වරදවල් සම්බන්ධයෙන් ඇතැම් තැනැත්තන් යටත් වන බව.

29. මේ ප්‍රඥප්තිය හෝ ප්‍රඥප්තිය යටතේ පැනවූ නියෝගයක් යටතේ වන වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු අවස්ථාවක,

i. ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම් වරද සිදු කරනු ලැබූ වේලාවේ දී ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකුව, සාමාන්‍යාධිකාරීවරයකුව, ලේකම්වරයකුව හෝ ඊට සමාන වෙනත් දෙපාර්තමේන්තු නිලධරයකුව සිටි සෑම තැනැත්තෙකුම,

ii. ඒ පුද්ගල මණ්ඩල ව්‍යාපාර ආයතනයක් නම් වැරදි සිදු කරනු ලබන වේලාවේ දී ඒ ව්‍යාපාර ආයතනයේ අයිතිකරුව හෝ හවුල්කරුවකුව සිටි සෑම තැනැත්තෙකුම වරද සිදු කරනු ලැබුවේ ඔහුගේ දැනුම හෝ අපහාසාකත්වය නොමැති බව සහ ස්වකීය කර්තව්‍යවල ස්වභාවය සහ සියලු අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන වරද සිදු කිරීම වැළැක්වීම සඳහා ඔහු විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ නිසි සියලු උද්යෝගය ඔහු ක්‍රියාත්මක කළ බව ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස ඔහු ඒ වරද සම්බන්ධයෙන් වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

නඩු පැවරීම සඳහා බලය දීම.

30. i. මෙම ප්‍රඥප්තිය යටතේ වූ වැරදි සම්බන්ධයෙන් නඩු කටයුතු පැවරීමේ කාර්යය සඳහා අධිකාරිය විසින් ලියවිල්ලක් මගින් බලය දෙනු ලැබූ නිලධරයකු හෝ සේවකයකු 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 136 වන වගන්තියේ අර්ථානුකූලව රජයේ නිලධරයකු ලෙස සැලකිය යුතු ය.

බස්රථ නැවතුම් ස්ථාන.

ii. අනවසරයෙන් බස් නැවතුම්පොළවලින් මගීන් ගැනීම හෝ පැටවීම ඊට සහාය වීමට මගීන් එක්රැස් කිරීමේ අරමුණෙන් ශබ්ද නගා කෑගැසීම, අධිකාරියේ නිලධාරීන්ගේ රාජකාරී කටයුතුවලට බාධා හෝ අවහිර වන ලෙස කටයුතු කිරීම, දඬුවම් ලැබිය හැකි වරදකි. එවැනි අවස්ථාවක පොලිස් නිලධාරීන්ට

හෝ අධිකාරියේ නිළධාරීන්ට එවැනි පුද්ගලයින්ට එරෙහිව අදාල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය හැකි අතර නඩු විභාගයකින් වැරදිකරු වුවහොත් රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු තුනක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.

iii. අධිකාරිය විසින් නිකුත් කරන ලද යම් අවසර පත්‍රයක් නොමැතිව පාසැල් ළමුන් ප්‍රවාහනය කිරීම නොකළ යුතු අතර, එසේ කිරීම මෙම ප්‍රඥප්තිය යටතේ දඩුවම් ලැබිය හැකි වරදකි. ඉහත වරද සිදු කරන තැනැත්තා හෝ එම වරද සඳහා රු. 2000.00 ක ස්ථානීය දඩයක් අධිකාරියේ බලය ලත් නිලධාරියෙකුට අය කල හැකිය. එසේ නැතහොත් එවැනි අවස්ථාවක පොලිස් නිළධාරීන්ට හෝ අධිකාරියේ නිළධාරීන්ට එවැනි පුද්ගලයින්ට එරෙහිව අදාල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය හැකි අතර නඩු විභාගයකින් වැරදිකරු වුවහොත් රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු තුනක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.

අවසර පත්‍ර නොමැතිව පාසැල් ළමුන් ප්‍රවාහනය.

iv. අධිකාරිය විසින් නිකුත් කරන ලද යම් අවසර පත්‍රයක් නොමැතිව කර්මාන්ත ශාලා හෝ සේවා ස්ථාන සඳහා සේවකයින් ප්‍රවාහනය කිරීම නොකළ යුතු අතර, එසේ කිරීම මෙම ප්‍රඥප්තිය යටතේ දඩුවම් ලැබිය හැකි වරදකි. එම වරද සිදු කරනු ලබන තැනැත්තාගෙන් අයවිය යුතු ගාස්තුව මෙන් දෙගුණයක් හා රු. 1000.00 ක ස්ථානීය දඩයක් (සේවා ගාස්තුවක්) අධිකාරිය විසින් බලය දෙනු ලබන අධිකාරියේ යම් නිලධරයකුට ගෙවිය යුතු ය. එවැනි අවස්ථාවක පොලිස් නිලධාරීන්ට හෝ අධිකාරියේ නිළධාරීන්ට එවැනි පුද්ගලයින්ට එරෙහිව අදාල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය හැකි අතර, නඩු විභාගයකින් වැරදිකරු වුවහොත් රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු තුනක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.

බලපත්‍ර නොමැතිව වෙනත් පොදු මඟී ප්‍රවාහන සේවා සැපයීම.

v. අධිකාරිය විසින් නිකුත් කරන ලද යම් අවසර පත්‍රයක් නොමැතිව ත්‍රීරෝද (ට්‍රයිසිකල්) රථ වලින් මඟීන් ප්‍රවාහනය කිරීම නොකල යුතු අතර, එසේ කිරීම මෙම ප්‍රඥප්තිය යටතේ දඩුවම් ලැබිය හැකි වරදකි. එම වරද සිදු කරනු ලබන තැනැත්තාගෙන් අයවිය යුතු ගාස්තුව මෙන් දෙගුණයක් හා රු. 1000.00 ක ස්ථානීය දඩයක් (සේවා ගාස්තුවක්) අධිකාරිය විසින් බලය දෙනු ලබන අධිකාරියේ යම් නිලධරයකුට ගෙවිය යුතු ය.

බලපත්‍ර නොමැතිව ත්‍රීරෝද රථ මගින් මඟී ප්‍රවාහනය.

එසේ දඩ මුදල නොගෙවන්නේනම්, එවැනි අවස්ථාවක පොලිස් නිලධාරීන්ට හෝ අධිකාරියේ නිලධාරීන්ට එවැනි පුද්ගලයින්ට එරෙහිව අදාල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය හැකි අතර නඩු විභාගයකින් වැරදිකරු වුවහොත් රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු තුනක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.

vi. අධිකාරිය විසින් නිකුත් කරන ලද යම් අවසර පත්‍රයක් නොමැතිව භාණ්ඩ ප්‍රවාහනය කිරීම දඩුවම් ලැබිය හැකි වරදකි.එම වරද සිදු කරනු ලබන තැනැත්තාගෙන් අයවිය යුතු ගාස්තුව මෙන් දෙගුණයක් හා රු. 1000.00 ක ස්ථානීය දඩයක් (සේවා ගාස්තුවක්) අධිකාරිය විසින් බලය දෙනු ලබන අධිකාරියේ යම් නිලධරයකුට ගෙවිය යුතු ය.එසේ දඩ මුදල නොගෙවන්නේනම්, එවැනි අවස්ථාවක පොලිස් නිලධාරීන්ට හෝ අධිකාරියේ නිලධාරීන්ට එවැනි පුද්ගලයින්ට එරෙහිව අදාල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය හැකි අතර නඩු විභාගයකින් වැරදිකරු වුවහොත් රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු තුනක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.

31. අධිකාරිය විසින් මෙම ප්‍රඥප්තිය යටතේ අධිකාරිය වෙත පවරා ඇති බලතල කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීමේදී හෝ අධිකාරිය විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් එසේ බලය පවරන ලද කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීමේදී ඊට නීති විරෝධී ලෙසින් බාධා පමුණුවන මැදිහත් වන එරෙහි වන හෝ බලපෑම් කරන තදනන්තර ප්‍රතිරෝධය පාන නැතහොත් එසේ කිරීමට උත්සාහ දරන ඕනෑම තැනැත්තෙකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයෙන් පසු වරදකරු කරනු ලැබූ විට රු. දෙදහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන සිර දඬුවමකට හෝ ඒ දෙකටම යටත් විය යුතු ය.

අධිකාරියට බාධා කිරීම බලපෑම් කිරීම.

## VII වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

32. i. අධිකාරිය විසින් එහි බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් අධිකාරියට කලින් කලට පොදු හෝ විශේෂ විධි විධාන නිකුත් කරනු ලැබිය හැකි වන අතර අධිකාරිය ඒ විධාන ක්‍රියාත්මක කල යුතු ය.

විධාන නිකුත් කිරීමට අමාත්‍යවරයාට ඇති බලය.

ii. අධිකාරියේ කටයුතු සම්බන්ධයෙන් තමා විසින් නියම කරනු ලබන ආකෘතියකින් තමා වෙත වාර වාර්තා ගිණුම් සහ වෙනත් තොරතුරු සපයන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කලට අධිකාරියට විධාන කරනු ලැබිය හැකි අතර, අධිකාරිය විසින් ඒ සෑම විධානයක්ම ඉටු කල යුතු ය.

වාහනයට ඇතුළුවීම සහ සෝදිසි කිරීම.

33. අධිකාරිය විසින් බලය දෙන හා වෙනත් කිසියම් අධිකාරී බලයක් ඇති යම් තැනැත්තෙකු විසින් කවර හෝ වේලාවක වයඹ පළාත ඇතුලත කවර හෝ ස්ථානයක දී,

i. භාණ්ඩ හෝ මගී ප්‍රවාහන සේවාවේ යෙදෙන යම් මෝටර් වාහනයක ඒ සඳහා වන බලය මෙම ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් ආයතනයකින් ලැබ ඇත්ද යන වග එම අවසර පත්‍රයට අදාල කොන්දේසි එකී වාහනයේ රියදුරු,කොන්දොස්තර,රිය සහායක හෝ භාරව සිටින තැනැත්තා විසින් පිළිපැද ඇත්ද යන්න, ප්‍රඥප්තියේ විධාන හෝ රෙගුලාසි පිළිපැද ඇත්ද යන්න දැන ගැනීම සඳහා එකී වාහනයට ඇතුල්වීම හෝ වාහනය සෝදිසි කිරීම කල හැකි ය.

ii. මගී හෝ භාණ්ඩ ප්‍රවාහනය සඳහා අදාල වාහනයට අධිකාරිය විසින් නිකුත් කර ඇති අවසර පත්‍රය හෝ එකී වාහනය වෙනුවෙන් ප්‍රදානය කරන ලද වෙනත් යම් ලේඛනයක් හෝ ඉදිරිපත් කරන ලෙසට එම වාහනයේ රියදුරුට කොන්දොස්තරට හෝ රිය සහායකයාට හෝ භාරව සිටින්නාට නියම කල හැක. නැතහොත්,

iii. ඒ අවසර පත්‍රය හෝ වෙනත් ලේඛන හෝ එහි පිටපත් තමන්ගේ භාරයට ගත හැකි ය.

iv. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන රියදුරු බලපත්‍රය වාර්ෂික ආදායම් බලපත්‍රය හා අදාල යැයි හැගෙන වෙනත් ලියකියවිලි පරීක්ෂා කල හැකි ය.

34. i. *(අ)* අධිකාරිය විසින් මේ ප්‍රඥප්තිය යටතේ සද්භාවයෙන් කරනු ලැබූ හෝ කරන ලදැයි කියනු ලබන හෝ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකාරියට විරුද්ධව නැතහොත්,

නඩු පවරනු ලැබීමෙන් ආරක්ෂාව.

*(ආ)* අධිකාරියේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් මේ ප්‍රඥප්තිය යටතේ හෝ අධිකාරියේ විධානය පිට සද්භාවයෙන් කරන ලද හෝ කරනු ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට නිලධරයාට හෝ සේවකයාට විරුද්ධව කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

ii. අධිකාරියට එරෙහි වූ යම් සිවිල් හෝ අපරාධ නඩුවකදී අධිකාරිය විසින් දරන ලද යම් වියදමක් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.එවැනි සිවිල් හෝ අපරාධ නඩුවකින් අධිකාරිය විසින් අය කර ගනු ලබන යම් වියදමක් හෝ වන්දියක් අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය. අදාල වරදට සම්බන්ධ නිලධාරියා මෙම ප්‍රඥප්තිය හෝ අධිකාරිය විසින් පනවන ලද නීති / රෙගුලාසි උල්ලංඝනය කර ඇති අවස්ථාවක ඔහු ඒ සම්බන්ධයෙන් පෞද්ගලිකව වගකිව යුතු අතර අදාල මුදල අධිකාරියේ අරමුදලින් ගෙවීම සම්බන්ධයෙන් තීරණය කිරීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩලය සතු වන්නේය.

ස්ථානීය සේවා ගාස්තු.

35. i. අධිකාරිය විසින් බලය පවරනු ලැබූ යම් නිලධාරියකු විසින් හෝ මේ ප්‍රඥප්තිය යටතේ වන අවසර පත්‍රයක අධිකාරිය යටතේ මගී හෝ භාණ්ඩ ප්‍රවාහනය කරන මෝටර් රථයකට අදාල මෙම ප්‍රඥප්තියේ නියමිත විධි විධාන කිසිවක් කඩකර ඇති විටකදී එකී කඩ කිරීම පිළිබඳ වගකීම සිය කැමැත්තෙන් පිළිගන්නා යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම සම්බන්ධයෙන් නඩු පවරනු ලැබීම වෙනුවට වලංගුව පවතින්නා වූ උපරිම ස්ථානීය සේවා ගාස්තුවකට යටත්ව සේවා ගාස්තුව නියම කරනු ලැබිය හැකිය. ඒ පිළිබඳව බලය පවරනු ලැබූ නිලධාරියා විසින් හෝ එකී නිලධාරියා විසින් සුදුසු පරිදි ධාවන මාර්ගය හා මෝටර් වාහනයේ අංකයද සහිතව අධිකාරියට දැන්විය යුතුවේ.

ii. එවැනි ස්ථානීය සේවා ගාස්තුවක් අධිකාරිය වෙත හෝ අධිකාරියේ උප කාර්යාලයකට අධිකාරියේ අරමුදලට බැර වන සේ ගෙවා, ගෙවීම් සාක්ෂි වශයෙන් වරද සොයාගත් දින සිට දෙසතියක් තුල අදාල ලදුපත අධිකාරිය වෙත ඉදිරිපත් කල යුතුවේ.

අවසර පත්‍ර ප්‍රදර්ශනය කළ යුතු ය.

36. මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයක්ම එම බලපත්‍රය නිකුත් කරනු ලැබූ මෝටර් වාහනයේ ඉදිරිපස වාමුවාවේ පැහැදිලිව පෙනෙන අයුරින් ප්‍රදර්ශනය කල යුතු ය.

37. හුදෙක්ම මගී ප්‍රවාහන සේවාවේ උන්නතිය සලකා යෝග්‍ය අවස්ථාවන්හිදී පොදු රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව බස් රථ මිලදී ගැනීම සඳහා පහසුකම් සහ බදු සහන ලබා දීම සඳහා අධිකාරිය විසින් නිර්දේශ නිකුත් කළ හැකිය. බස්රථ මිලට ගැනීම සඳහා නිර්දේශ කිරීම.

38. i. *(අ)* අමාත්‍යවරයා විසින් මෙම ප්‍රඥප්තියේ විධි විධාන ක්‍රියාත්මක කිරීමේ සහ බලාත්මක කිරීමේ කාර්ය සඳහා නියෝග සාදනු ලැබිය හැකිය. ප්‍රඥප්තිය යටතේ නියෝග සෑදීම.

ii. *(අ)* ඉහත 38 (1) අ වන උප වගන්තිය මගින් පිරිනමනු ලබන බලතලවල පොදුභාවයට අගතියක් නොවන පරිදි අමාත්‍යවරයා විසින් පහත සඳහන් සියළු හෝ එක් එක් කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකිය.

*(ආ)* මේ ප්‍රඥප්තිය යටතේ නියෝග සෑදීම සඳහා නියමිත හෝ බල දෙනු ලබන සියළු කාරණා

(ඇ) අවසර පත්‍ර සහ වෙනත් අධිකාර නිකුත් කිරීම, අලුත් කිරීම, සංශෝධනය කිරීම, අයිතිය විධිමත් කිරීම හා ඊට ආනුශාංගික කටයුතුවලදී අනුගමනය කළයුතු ක්‍රියා පටිපාටිය සහ භාවිතා කළයුතු ආකෘති සහ ගෙවිය යුතු ගාස්තු නියම කිරීම.

(ඈ) මාර්ගවල යෝග්‍යතාවය සහ භාවිතය අනුව එකී මාර්ගයන්වල ගාස්තු මත මගී ප්‍රවාහනය හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා පාවිච්චි කළ යුතු මෝටර් වාහන නියම කිරීම සහ එකී මෝටර් වාහන පාවිච්චි කිරීම සම්බන්ධයෙන් පිළිපැදිය යුතු සම්මතයන් නියම කිරීම.

(ඉ) අවසර පත්‍රයක බලය යටතේ යොදා ගනු ලබන වාහනයක රියදුරු, කොන්දොස්තර, රිය සහායක හෝ වාහනය භාරව සිටින තැනැත්තා විසින් රැගෙන යායුතු ලේඛණ සහ ඒවායේ ඇතුළත්විය යුතු සහ ඇතුලත් කළ යුතු විස්තර,

(ඊ) නිත්‍ය මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක බලය යටතේ යොදා ගනු ලබන බස් රථවල ගමන් වාර සම්බන්ධයෙන් තබාගත යුතු වාර්තා,

(උ) අවසර පත්‍රයක බලය යටතේ යොදා ගනු ලබන වාහනයක් පාවිච්චි කරනු ලබන යම් තැනැත්තෙකු විසින් පිළිපැදිය යුතු සම්මතයන්,

(ඌ) නිත්‍ය මගී හා ප්‍රවාහන සේවා අවසර පත්‍ර දරන්නන් විසින් ඒවා අවසර පත්‍රවල බලය යටතේ යොදා ගනු ලබන බස් රථවල රියදුරන්, කොන්දොස්තරවරුන් හා රිය සහායකයන් ලෙස සේවා නියුක්ත කරනු ලැබූ තැනැත්තන් සම්බන්ධයෙන් සහ ඒ තැනැත්තන් සේවය ආරම්භ කරන හා අවසන් කරන වේලාව සහ ඔවුන් විසින් ගනු ලබන විවේක කාලයන් සම්බන්ධයෙන් ඒ අවසර පත්‍ර දරන්නන් විසින් තබාගත යුතු වාර්තා.

(එ) එසේ තබා ගනු ලබන වාර්තා සුරක්ෂිතව තබා ගැනීම, අධිකාරිය විසින් බලය දෙන ලද තැනැත්තකු විසින් ඒ වාර්තා පරීක්ෂා කිරීම සහ එසේ බලය දෙන ලද තැනැත්තකු විසින් ඉල්ලා සිටින විට ඒ වාර්තා පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කිරීම.

(ඒ) අවසර පත්‍රවල අධිකාරිය යටතේ මගී ප්‍රවාහනයේ හෝ භාණ්ඩ ප්‍රවාහනයේ යෙදෙන රියදුරන් කොන්දොස්තරවරුන් සහ රිය සහායකයින් ලියාපදිංචි කිරීම, එම ලියාපදිංචි කිරීම අලුත් කිරීම්, අවලංගු කිරීම් සහ අත්හිටුවීම් සම්බන්ධයෙන් කාර්ය පටිපාටිය සැකසීම.

(ඔ) අවසර පත්‍රවල අධිකාරිය යටතේ නිත්‍ය මගී ප්‍රවාහන සේවයේ යෙදෙන මෝටර් වාහනවල රියදුරන් සහ කොන්දොස්තරවරුන් විසින් පැළඳ සිටිය යුතු / නිළ ඇඳුම් සහ ලාංඡන නියම කිරීම, එම වාහන වල රියදුරන්, රිය සහායකයින් සහ කොන්දොස්තරවරුන් මගී ප්‍රවාහනයේ යෙදෙන අවස්ථාවලදී ඔවුන් විසින් අනුගමනය කළ යුතු විනය නීති නියම කිරීම.

(ක) විශේෂයෙන්ම බස් ධාවනය ඒකාබද්ධ කිරීම හා වේලාවන් සටහන් කිරීම සහ පහසුකම් නිසි පරිදි සහ සාධාරණ ලෙස සැලසීම සඳහා බස් රථ ගාල් බස් නැවතුම් පොලවල් හා මාර්ගස්ථ නැවතුම් ස්ථාන කළමනාකරණය කිරීම සම්බන්ධව,

(ග) පළාත තුළ මගී ප්‍රවාහන අවසර පත්‍රයක් හෝ යම් අධිකාරී බලයක් යටතේ ධාවනය කරනු ලබන පාසල් වෑන්රථ ත්‍රීරෝද රථ (ට්‍රයිසිකල්), කුලී රථ සඳහා වෙනත් නීතියක් යටතේ ආවරණය නොවන මගී ප්‍රවාහන සේවා සඳහා අය කළ යුතු ගාස්තු නියම කිරීම, නිශ්චය කිරීම හා ඒවා සංශෝධනය කිරීම.

(ජ) නිත්‍ය මගී හා භාණ්ඩ ප්‍රවාහන සේවා සහ විශේෂ මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රවල බලය යටතේ යොදා ගනු ලබන රියදුරන්, රිය සහායකයින්ගේ හා කොන්දොස්තරවරුන්ගේ අවම සුදුසුකම් නියම කිරීම සහ ඔවුන්ගේ ශාරීරික සහ මානසික යෝග්‍යතා කලින් කල පරීක්ෂණයට භාජනය කරවීම.

(ට) අන්තර් පළාත් බලපත්‍රලාභී බස්රථ වයඹ පළාත තුළ මගී ප්‍රවාහනයේ දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග හා ගාස්තු අය කිරීම පිළිබඳව රෙගුලාසි පැනවීම.

III. මෙහි 38 (1) අ වැනි උප වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පල කරනු ලැබිය යුතු අතර එසේ පල කරනු ලබන දිනයෙහි හෝ නියෝගයේ සඳහන් වන යම් පසු දිනක හෝ එය ක්‍රියාත්මක වන්නේ ය.

IV. මෙහි 1 වැනි උප වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම ඒවා ගැසට් පත්‍රයේ පල කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මනින් අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එසේ ඉදිරිපත් කිරීමෙන් පසු අනුමත නොකරන ලද යම් නියෝගයක් වෙතොත් එය යටතේ කලින් කරන ලද ක්‍රියාවකට හානියක් නොමැතිව අනුමත දින සිට එම නියෝගය පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

V. යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය ගැසට් පත්‍රයේ පල කරනු ලැබිය යුතු ය.

## VIII වැනි කොටස

### ඉවත් කිරීම සහ අන්තර් කාලීන විධිවිධාන

ඉවත් කරන ලද ප්‍රඥප්ති යටතේ රෙගුලාසි (නියෝග)

39. අමාත්‍යවරයා විසින් මෙම ප්‍රඥප්තියේ 5 (1) වන වගන්තිය යටතේ අධිකාරියේ සාමාජිකයන් පත් කරන තුරු වයඹ පළාතේ 1995 අංක 04 දරන මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය යටතේ පත් කරනු ලැබ මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට පූර්වාසන්නයෙන් වූ දිනය දක්වා 1995 අංක 04 වයඹ පළාතේ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ සාමාජික ධුර දරන ලද සියළුම සාමාජිකයන් මෙම ප්‍රඥප්තිය යටතේ පත් කරන ලද අධිකාරියේ සාමාජිකයින් ලෙස සැලකිය යුතු වන්නේය.

අධිකාරියේ සේවා නියුක්තයන්.

40. i. ප්‍රඥප්තියේ ක්‍රියාත්මක දිනයට පෙරාතුව වූ දිනයේදී 1995 අංක 04 වයඹ පළාතේ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය යටතේ සේවයේ නියුක්ත සියලු නිළධාරීන් හා වෙනත් සේවා නියුක්තයන් ඔවුන් එකී මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය යටතේ වූ සේවා නියුක්තියට සම්බන්ධ නියමයන් හා කොන්දේසිවලට යටත්ව අධිකාරියේ සේවාවේ සේවා නියුක්තයන් ලෙස සලකනු ලැබිය යුතු ය. එම සේවා නියුක්තයන්ගේ සේවය ඔවුන්ගේ සේවා නියුක්තිය පිළිබඳව නීත්‍යානුකූල හේතු මත හැර වෙනත් ආකාරයකට අවසන් කරනු නොලැබිය යුතු ය.

ගිවිසුම් අයිතිවාසිකම් බැදීම්, වගකීම් සහ පවරා ඇති සහ පවතින නඩු සඳහා වූ ප්‍රතිපාදන.

ii. ප්‍රඥප්තියේ ක්‍රියාත්මක දිනයට පෙරාතුවම දිනයේදී 1995 අංක 04 දරන වයඹ පළාතේ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය යටතේ ස්ථාපිත එකී අධිකාරිය සතු සියලුම අරමුදල් ද ඇතුළුව එකී අධිකාරියේ සියලු නිශ්චල සහ චංචල දේපල අධිකාරිය වෙත සතු කළ යුතු අතර එකී සියලු දේපල අධිකාරියේ දේපලක් විය යුතු ය.

iii. ප්‍රඥප්තියේ ක්‍රියාත්මක දිනයට පෙරාතුව වූ දිනයේදී බලාත්මකව පවතින 1995 අංක 04 දරන වයඹ පළාතේ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය යටතේ ස්ථාපිත වයඹ පළාතේ මගී ප්‍රවාහන සේවා අධිකාරිය

විසින් එළඹ ඇති සේවක අර්ථ සාධක අරමුදල සහ සේවා නියුක්ත භාරකාර අරමුදල සහ පාරිතෝෂික සම්බන්ධ සියලු බැඳීම සහ වගකීම් ඇතුළු සියලු කොන්ත්‍රාත් සහ ගිවිසුම් අධිකාරියේ කොන්ත්‍රාත් සහ ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතු ය.

iv. ප්‍රඥප්තියේ ක්‍රියාත්මක දිනයට පෙරාතුව වූ දිනයේදී යම් අධිකරණයක හෝ විනිශ්චය සභාවක 1995 අංක 04 දරන වයඹ පළාතේ මගී ප්‍රවාහන සේවා අධිකාරිය විසින් හෝ එම අධිකාරියට විරුද්ධව පවරා ඇති හෝ ඉදිරිපත් කරන ලද නඩුවක්, ඉල්ලීමක් හෝ අභියාචනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒවා පවත්වාගෙන යාම හෝ අවසන් කරනු ලැබීම කල හැකිය.

v. නියමිත දිනට පෙරාතුව වූ දිනයේදී 1995 අංක 04 දරන වයඹ පළාතේ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය යටතේ ස්ථාපිත වයඹ පළාතේ මගීප්‍රවාහන සේවා අධිකාරිය විසින් හෝ ඊට එරෙහිව පවරා ඇති හෝ ඉදිරිපත් කර ඇති යම් නඩුවකදී ඉල්ලීමකදී හෝ අභියාචනයකදී අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරියක් විසින් වාර්තා ගත කොට ඇති හෝ ප්‍රදානය කරනු ලැබ නියමිත දිනයට පෙරාතුවම වූ දිනයේදීම එය සම්පූර්ණයෙන්ම හෝ කොටසක් ඉටුකර නොමැතිව ඉතිරිව පවතින යම් තීන්දු ප්‍රකාශයක් හෝ ප්‍රදානයක් අවස්ථාවෝචිත පරිදි අධිකාරියට වාසියට හෝ එයට එරෙහිව වාර්තා ගත කොට ඇති හෝ ප්‍රදානය කරන ලද තීන්දු ප්‍රකාශයක් බවට හෝ ප්‍රදානයක් බවට හෝ සලකනු ලැබිය යුතු අතර සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධි විධානවලට හෝ තීන්දු ප්‍රකාශයක් හෝ ප්‍රදානයක් ක්‍රියාවේ යෙදවීමට අදාල වෙනත් යම් ප්‍රඥප්තියකට යටත්ව අධිකාරිය විසින් හෝ එයට එරෙහිව ක්‍රියාවේ යෙදිය හැකිය.

vi. 1995 අංක 04 දරන වයඹ පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද්දාවූ ද, නැතහොත් එකී ප්‍රඥප්තිය යටතේ මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් ලෙස සලකනු ලැබුවා වූද, මෙම ප්‍රඥප්තිය බලාත්මක වන දිනට පූර්වාසන්නයේ වලංගුව ඇත්තාවූද, මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් හෝ වෙන යම් ලියකියවිල්ලක් මෙම ප්‍රඥප්තිය යටතේ කලින් නිකුත් කර අවලංගු කරනු නොලැබුවහොත් එහි සඳහන් වලංගු කාලය තුල මෙම ප්‍රඥප්තිය නිකුත් කරන ලද මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

41. මෙම ප්‍රඥප්තිය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

## IX වැනි කොටස

### අර්ථ නිරූපණය

42. මෙම ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

- "අමාත්‍යවරයා" යන්නෙන් වයඹ පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ ප්‍රවාහන සේවා විෂයභාර අමාත්‍යවරයා අදහස් වන්නේය,
- "අමාත්‍ය මණ්ඩලය" යන්නෙන් වයඹ පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලය අදහස් වන්නේය.
- "පළාත" යන්නෙන් වයඹ පළාත අදහස් වන්නේය.
- "සභාව" යන්නෙන් වයඹ පළාත් සභාව අදහස් වන්නේය.
- "නිළධාරියා" යන්නෙන් වයඹ පළාත් ප්‍රවාහන සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් ඇතුළුව අධිකාරියේ සේවය කරන සියලු සේවකයින් අදහස් වන්නේය.
- "ජ්‍යේෂ්ඨ නිළධාරියකු" යන්නෙන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සහකාර ලේකම් ධුරයට නොඅඩු ධුරයක නිලධාරියකු හෝ ඒ හා සමාන්තර සේවා වල ඒ හා සමාන නිලයක් දරන අයකු අදහස් වන්නේය.
- "අවසර පත්‍රය" යන්නෙන් "මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රය", "භාණ්ඩ ප්‍රවාහන සේවා අවසර පත්‍රය", "විශේෂ සේවා අවසර පත්‍රය", "මාර්ග බලපත්‍රය" හා "නිත්‍ය ප්‍රවාහන සේවා අවසර පත්‍රය", "පාසැල්

සේවා අවසර පත්‍රය", "කර්මාන්ත ශාලා ප්‍රවාහන සේවා අවසර පත්‍රය" යන නම් වලින් කුමන හෝ නමකින් මෙම ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ ගාස්තුවක්, ත්‍යාගයක්,ප්‍රතිලාභයක් හෝ වෙන් වෙන් ගාස්තු මත මෝටර් වාහනයක් මගින් මගී ප්‍රවාහනයේ හෝ භාණ්ඩ ප්‍රවාහනයේ යොදා ගැනීම සඳහා බලය දෙමින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් අදහස් වන්නේය.

- "ප්‍රවාහන සේවා" යන්නෙන් මගීන් හෝ භාණ්ඩ ප්‍රවාහනය කරන කුමන හෝ මෝටර් වාහනයක් අදහස් වේ.

- "බස් නැවතුම්පොල යන්නෙන්" වයඹ පළාත තුල පිහිටි බස් මගී පර්යන්ත යනුවෙන් අදහස් විය යුතු අතර, ගැසට් කරන ලද වයඹ පළාත තුල පිහිටි බස්රථ ගාල් අධිකාරිය සතු වයඹ පළාත තුල පිහිටි බස් නැවතුම්පොලවල් හා මහ මග දෙපස බස් නවත්වන ස්ථානද ඇතුළත් විය යුත්තේය.

- "ගැසට් පත්‍රයේ" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* අදහස් වන්නේය.

- "පළාත් පාලන ආයතන" යන්නෙන් මහ නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන්නේය.

- "බස් රථය හෝ ඔම්නි බස් රථය" යන්නෙන් මෝටර් රථ වාහන පනත යටතේ ඔම්නි බස් රථයක් වශයෙන් ලියාපදිංචි කරන ලද මෝටර් කෝච් රථයක් අදහස් වන අතර ඊට ද්විත්ව කාර්ය වාහනයක්ද ඇතුළත් වන සේ සලකනු ලැබිය යුතු ය.

- "මගියා" යනු කුලී රථයක හෝ බස් රථයක, **පාසැල් සේවා බස්රථයක හෝ වෑන් රථයක, කර්මාන්ත ශාලා බස් රථයක** ප්‍රවාහනය කෙරෙන එහෙත් රියදුරු හා බස් රථයක නම් කොන්දොස්තරවරයා / රිය සහායක ඇතුළත් නොවන පුද්ගලයකි.

- "වෙන් වෙන් ගාස්තුව" යන්නෙන් බස් රථයක මගියකු වශයෙන් ගෙන යනු ලැබීමට යම් තැනැත්තෙකුට හිමිකම් ලබා දෙන ඒ තැනැත්තා විසින් කරනු ලබන ගෙවීම අදහස් වේ.

- "මෝටර් වාහනය" යන්නෙන් මෝටර් රථ ප්‍රවාහන පනතේ අර්ථ නිරූපණය කර ඇති මෝටර් වාහනයක් අදහස් වේ.

- "මෝටර් රථය" යන්නෙන් මෝටර් රථ ප්‍රවාහන පනතේ අර්ථ නිරූපණය කර ඇති මෝටර් වාහනයක් අදහස් වේ.

- "ලොරිය" යන්නෙන් මෝටර් රථ ප්‍රවාහන පනතේ අර්ථ නිරූපණය කර ඇති මෝටර් වාහනයක් අදහස් වේ.

- "ට්‍රේලරය" මෝටර් රථ ප්‍රවාහන පනතේ අර්ථ නිරූපණය කර ඇති ට්‍රේලරය අදහස් වේ.

- "කුලී ධාවනය" යන්නෙන් මහා මාර්ගයක හෝ වෙනත් ස්ථානයක මගීන්ට කුලියට දීම සඳහා සිටුවා තැබීම,නතර කර තැබීම හෝ ධාවනය කිරීම අදහස් වේ.

- "මගී ප්‍රවාහන සේවාව" යන්නෙන් මහා මාර්ග ඔස්සේ ගාස්තුවක් අය කරමින් මගීන්, පාසැල් සිසුන්, කාර්යාල සේවකයින්, කර්මාන්තශාලා සේවකයින් ත්‍රිරෝද රථ (ට්‍රයිසිකල්) මගීන් ප්‍රවාහනය කරනු ලබන සෑම වාහනයක්ම අදහස් වේ.

- විධිමත් බඳවා ගැනීමේ පරිපාටිය යනුවෙන් අදහස් වන්නේ වයඹ පළාත් ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරනු ලබන බඳවා ගැනීමේ පරිපාටිය වේ.

- 26 වගන්තියේ "මෝටර් වාහනයක්" යන්නෙන් මගී ප්‍රවාහන සේවාවේ යෙදෙන මෝටර් වාහන අදහස් වේ.

- 27 වගන්තියේ "මෝටර් වාහනයක්" යන්නෙන් භාණ්ඩ ප්‍රවාහන සේවාවේ යෙදෙන ලොරි, ට්‍රේලර් වැනි මෝටර් වාහන අදහස් වේ.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා නිලධාරි තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018

බස්නාහිර පළාත් අධ්‍යාපන හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමට මෙම නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් ලත් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන් ම අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *වැටුප් ක්‍රමය :*

*(අ)* ක්‍රීඩා නිලධාරි III ශ්‍රේණිය

රු. 29,840/-10x300-11x350-10x560-10x660- රු. 48,890/රා.ප.ච.3/2016-MT1-2016 අනුව

03. *අධ්‍යාපන, වෘත්තීය හා වෙනත් සුදුසුකම් :*

3:1 *(අ)* අධ්‍යාපන සුදුසුකම් :

(i) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව වාර 2 කට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම, *සහ*

(ii) ජාතික ක්‍රීඩා විද්‍යායතනය මගින් පවත්වනු ලබන වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාව හදරා සමත්ව තිබීම.

*(ආ)* වෘත්තීය සුදුසුකම් :

(i) යම් කිසි ක්‍රීඩා ඉසව්වක ජාතික කණ්ඩායමේ සාමාජිකයකුව පිළිගත් ජාත්‍යන්තර තරගයකට සහභාගී වී තිබීම ;

*හෝ*

(ii) ක්‍රීඩා අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන ජාතික මහ ක්‍රීඩා උළෙලක දී යම් ඉසව්වකින් ජාතික මට්ටමින් 1, 2, 3 ස්ථාන ලබා තිබීම හෝ පළාත් මට්ටමින් 1, 2 ස්ථාන ලබා තිබීම හෝ ජාතික ක්‍රීඩා සංගම් මගින් පවත්වනු ලබන ප්‍රධාන ජාතික විවෘත තරගයක දී 1, 2, 3 ස්ථාන ලබා තිබීම.

*(ඇ)* කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකු ම බස්නාහිර පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරට අදාළ රාජකාරි ඉටු කිරීම සඳහාත් සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් තිබිය යුතුය. ශාරීරික යෝග්‍යතාව පිරික්සීම සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ පළාත් ක්‍රීඩා විද්‍යායතනයේ ක්‍රීඩා වෛද්‍ය ඒකකය විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය ප්‍රතික්‍රියා වේගය, නම්‍යතාවය, උදරයේ ශක්තිය, දෙඅත්වල ශක්තිය, උලඟිතාවය, හිටිදුර පැනීම, වේගය හා දරා ගැනීම යන අංගයන්ගෙන් සමන්විත වේ.

*(ඈ)* වෙනත් සුදුසුකම් :

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
(ii) යහපත් චරිතයකින් යුක්ත අයකු විය යුතු ය.
(iii) ආගමික හෝ ආගමික නිකායක පැවිදිවරයක් දරන තැනැත්තෙකු නොවිය යුතු ය.
(iv) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුන (03) ක කාලය තුළ බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය තිබිය යුතු ය. (ඡන්ද හිමි නාමලේඛණයේ නම ඇතුලත් විය යුතු ය.)
(v) දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම් ඔහු හෝ ඇය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 ක් තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලබා නො තිබිය යුතු අතර, එකී පූර්වාසන්න වසර 05 තුළ සියළු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු ය.
(vi) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය ඉහත සඳහන් සියලුම සුදුසුකම්, අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

3.2 2018.01.01. දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතු ය.

04. *සේවා කොන්දේසි :*

4.1 මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.

4.2 මෙම තනතුරට පත් කරනු ලබන්නන් අදාළ වන පරිදි අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වනු ඇත.

4.3 ආයතන සංග්‍රහයේ 1 වන කාණ්ඩයේ 11 වැනි පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වූ වගන්තිවල විධිවිධාන තනතුරට ගැලපෙන පරිදි අදාළ වනු ඇත.

4.4 සෑම නිලධාරියෙකුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ iv වන පරිච්ඡේදයේ විධිවිධාන හා රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා පනවා ඇති හා කලින් කල පනවනු ලබන අනෙකුත් නීති හා රෙගුලාසි පිළිපැදිය යුතු ය.

4.5 මෙම තනතුර සඳහා බඳවා ගැනීමේ/උසස් කිරීමේ පරිපාටියේ රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, පළාත් විනය කාර්ය සංග්‍රහය, පළාත් මුල්‍ය රීති සංග්‍රහය ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද රජය හා බස්නාහිර පළාත් සභාව විසින් නිකුත් කර ඇති හා වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසිවලට හා නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම නිලධාරීන් බැඳී සිටිය යුතු ය.

4.6 බඳවා ගන්නා ලද නිලධාරීන් ස්ථාන මාරුවීම්වලට යටත් විය යුතුය. බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශය තුළ නියම කරනු ලබන කවර හෝ ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය.-* සේවයට බඳවා ගැනීම ලිඛිත විභාගය, සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය මගින් සිදු කරනු ලබයි. ලිඛිත තරග විභාගයේ ප්‍රතිඵල මත 40% කට වඩා වැඩි ලකුණු ලබාගන්නා අයදුම්කරුවන්ගේ ලකුණු පිළිවෙළ අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබයි.

ඒ අනුව ව්‍යුහගත පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසු ලබාගන්නා ඒකාබද්ධ ලකුණු සංඛ්‍යාව අනුව සකසනු ලබන කුසලතා ලේඛනයට ඇතුළත් වන්නන් අතරින් ක්‍රීඩා විද්‍යාතනයේ හෝ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ වෛද්‍ය ඒකකයේ ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත්වන්නන් මෙම තනතුරු සඳහා බඳවා ගනු ලැබේ.

*ලිඛිත විභාගය :*

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය (කාලය පැය 01) | 100 | 40% |
| 2. භාෂා හැකියාව (කාලය පැය 01) | 100 | 40% |

*ලිඛිත විභාගයෙහි විෂය නිර්දේශය :*

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයා සතු සාමාන්‍ය බුද්ධිය, තර්කන හැකියාව, අදහස් ප්‍රකාශනය, සංඛ්‍යාත්මක කුසලතාවය හා අවබෝධාත්මක හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි. |
| 2. භාෂා හැකියාව | අක්ෂර වින්‍යාසය, වියරණ භාවිතය, නිරවුල් හා පැහැදිලි අදහස් ප්‍රකාශනය, භාෂාවේ යෙදුම් පිළිබඳ අවබෝධය, සාරාංශකරණය හා රචනාමය හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි. |

*ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :*

| *ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ* | *ලකුණු ලබා දෙන ආකාරය* | | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | ක්‍රීඩා ඩිප්ලෝමාව (වසර 1 හෝ ඊට වැඩි) | 05 | 10 |
| | සාමාන්‍ය උපාධිය | 07 | |
| | ක්‍රීඩා උපාධිය | 10 | |
| 2. ක්‍රීඩා දක්ෂතාවයන් | බඳවාගැනීමේ පරිපාටියෙහි 7.2.2.2 වගන්තියෙහි දක්වෙන ක්‍රීඩා තරග ජයග්‍රහණය සඳහා පමණක් ලකුණු හිමිවේ. | | 70* |
| 3. ක්‍රීඩා තරග සඳහා පුහුණු කිරීම, විනිශ්වය හෝ සංවිධානය | බඳවා ගැනීමේ පරිපාටියෙහි 7.2.2.2<br><br>වගන්තියෙහි විස්තර වන දිස්ත්‍රික්, පළාත්, ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ තරග සඳහා පුහුණු කිරීම/විනිශ්චය හෝ සංවිධානය කිරීම සඳහා පමණක් ලකුණු හිමි වේ. (ජාතික හෝ ජාත්‍යන්තර ක්‍රීඩා සංගම් විසින් ප්‍රදානය කළ සහතික / බලපත්‍ර ඉදිරිපත් කළ යුතුය.)<br><br>දිස්ත්‍රික් / පළාත් තරග 05<br>ජාතික තරග 07<br>ජාත්‍යන්තර තරග 10 | | 15 |
| 4. පෞරුෂත්වය | | | 05 |
| සුදුසුකම් සනාථ කරනු ලැබූ සහතික නැවත පරීක්ෂා කිරීම සහ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම ද ව්‍යුගහත සම්මුඛ පරීක්ෂණයේ දී සිදු කරනු ලැබේ. | | | |

- ක්‍රීඩා දක්ෂතාවයන් සඳහා ලකුණු ලබාදෙන ආකාරය විස්තරාත්මකව පහත දක්වේ. (උපරිම දක්ෂතාවය සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.)

| ක්‍රීඩා තරග මට්ටම් | 1 | 2 | 3 |
|---|---|---|---|
| පළාත් තරග | 20 | 15 | |
| ජාතික තරග | 45 | 42.5 | 40 |
| දකුණු ආසියාතික තරග | 55 | 52.5 | 50 |
| ආසියාතික ශූරතා, පොදු රාජ්‍ය මණ්ඩලීය ශූරතා තරගයක 1-2 හෝ 3 වන ස්ථාන ජයග්‍රහණය | | 65 | |
| ආසියාතික ශූරතා, පොදු රාජ්‍ය මණ්ඩලීය ශූරතා, ලෝක කුසලාන, ඔලිම්පික් තරගයක 1-2 හෝ 3 වන ස්ථාන ජයග්‍රහණය | | 70 | |

06. *විභාග ගාස්තු.*- විභාග ගාස්තු වශයෙන් රු. 500/- ක් බස්නාහිර පළාත් අධ්‍යාපන හා ක්‍රීඩා අමාත්‍යාංශය වෙත ගෙවා ලබා ගන්නා ලද රිසිට්පත අයදුම්පත්‍රයේ නියමිත තැන ඇලවිය යුතුය. එසේ මුදල් ගෙවා ලබාගත් ලදුපත් හැර වෙනත් ආයතනවලට ගෙවා ලබාගත් ලදුපත්, මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලබන අතර, කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන බව සැලකිය යුතුයි.

07. *ඉල්ලුම් කළයුතු පිළිවෙල :*

7.1 මෙම නිවේදනයේ අග ඇති ආදර්ශ අයදුම්පතට අනුව A 4 ප්‍රමාණයේ (සෙ.මී. 21x29) කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කර ගත යුතුය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් "ලේකම්, බස්නාහිර පළාත් අධ්‍යාපන හා ක්‍රීඩා අමාත්‍යාංශය, අංක 89,4 වන මහල, රන්මග පාය, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ක්‍රීඩා නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම 2018" යනුවෙන් සඳහන් කළ යුතුය.

7.2 දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

7.3 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති, නිසි ලෙස තොරතුරු ඇතුළත් නොකළ, අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තව ද, සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූලව ද යන්න පිළිබඳව විමසා බැලීම අයදුම්කරු සතු වගකීමකි. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරු විසින් දරා ගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළග තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

8. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2018.03.29 වේ.

9. මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරා නොමැති අයගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ ලිපි ලේඛනවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුයි. සෑම අයදුම්කරුවෙක්ම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

10. විභාගය සඳහා අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම තනතුර සඳහා වන මූලික සුදුසුකම් සැපිරීම ලෙස නොසැලකිය යුතුය.

11. යම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව පත්වීම් ලැබීමට පෙර ඕනෑම අවස්ථාවක අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත. පත්වීම් ලැබීමෙන් පසු හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කෙරෙනු ඇත.

12. මෙම විභාගය පැවැත්වීම හෝ නොපැවැත්වීම හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම් කිරීම/නොකිරීම හෝ පුරප්පාඩු පිළිබඳ අවසාන තීරණය බස්නාහිර පළාත් අධ්‍යාපන හා ක්‍රීඩා අමාත්‍යාංශය සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති අවස්ථාවක් වෙතොත් ඒ පිළිබඳ අවසාන තීරණය ද බස්නාහිර පළාත් අධ්‍යාපන හා ක්‍රීඩා අමාත්‍යාංශය සතුය.

එස්. ජී. විජයබන්ධු,
ලේකම්,
බස්නාහිර පළාත් අධ්‍යාපන හා ක්‍රීඩා අමාත්‍යාංශය.

අංක 89, 4 වන මහල,
රන්මග පාය,
බත්තරමුල්ල.

(මෙම දැන්වීම පදනම් කරගෙන විවිධ ආයතන විසින් සාවද්‍ය ලෙස සකස්කර ඉදිරිපත් කරනු ලබන දැන්වීම්වල සඳහන් කරුණු සහ අයදුම්පත්‍ර කෙරෙහි කිසිදු වගකීමක් දරනු නොලැබේ.)

ආදර්ශ අයදුම්පත්‍රය

බස්නාහිර පළාත් අධ්‍යාපන, ක්‍රීඩා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ක්‍රීඩා නිලධාරි තනතුරට බඳවා ගැනීම - 2018

විභාග අංකය : [ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා.)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : [ ]
සිංහල - 2, දෙමළ - 3, ඉංග්‍රීසි - 4

01 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :........................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : SILVA A. B.

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :........................................

........................................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :........................................

........................................

1.4 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :........................................

........................................
(ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

1.5 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :........................................

........................................

1.6 දුරකථන අංකය : නිවස :........................ ජංගම :........................

1.7 ඔබ දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවෙක් නම්.-

තනතුරු නාමය :........................
පත්වීම් දිනය :........................

02. 2.1 ස්ත්‍රී/පුරුෂ භාවය : (ස්ත්‍රී - 1, පුරුෂ - 0) [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

2.2 විවාහක/අවිවාහක බව : [ ]
(විවාහක - 1, අවිවාහක -2)

2.3 ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

03. උපන් දිනය : අවුරුද්ද : [ ][ ][ ][ ] මාසය : [ ][ ] දිනය : [ ][ ]

2018.01.01 දිනට වයස :

අවුරුදු : [ ][ ] මාස : [ ][ ] දින : [ ][ ]

04. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

4.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය :

වර්ෂය :————. විභාග අංකය :————.

*පළමුවර :*

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

*දෙවනවර* (සුදුසුකම් සම්පූර්ණ කරන ලද විභාගයේ තොරතුරු) :

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

අ.පො.ස. (උසස් පෙළ) විභාගය :

වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |

4.2 වෘත්තීය සුදුසුකම්.-..........................................................................................................................................................
.........................................................................................................................................................................
.........................................................................................................................................................................
(අයදුම්පත්‍රය සමග වෙනත් කිසිදු සහතිකයක් ඉදිරිපත් නොකළ යුතු ය.)

05. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය :————.
දිනය :————.

| ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න. |
| --- |

06. *අයදුම්කරුගේ සහතිකය :*

.................................................................................................... වන මා අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ................ හා වැනි දින දරන ලදුපත මෙහි අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද, විභාග නීති රීති වලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන තීරණයට මම එකඟ වෙමි. තවද විභාගය පැවත්වීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් අධ්‍යාපන හා ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ගනු ලබන නීතිරීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

..................................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................................................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය ......................................................... දින මා ඉදිරිපිට දී ඔහු/ඇය ගේ අත්සන තැබූ බවත්, නියමිත විභාග ගාස්තු ගෙවා ලදුපත මෙහි අලවා ඇති බවත් සහතික කරමි.

සහතික කරන අයගේ නම :————.
අත්සන :————.
තනතුර හා නිල මුද්‍රාව :————.
දිනය :————.

(රජයේ විදුහලක විදුහල්පතිවරයකු/සාමදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු/නීතිඥයකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාර බලය ලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 5,71,380/- කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන, ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියකු හෝ විසින් මෙම සහතික කිරීම කරනු ලැබ තිබිය යුතුයි.)

රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය (අනවශ්‍ය වචන කපා හරින්න)

........................................................................................................ මයා/මිය/මෙනවිය දැනට ............................................................. අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරන බවත් ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බවත් ඔහු/ඇය රාජ්‍ය සේවයෙන් පහකර ඇති/නැති බවත්, තනතුර අතහැර ගිය අයකු සේ සලකා ඇති/නැති බවත් සහතික කරන අතර, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිය/නොහැකි බව ප්‍රකාශ කරමි.

.......................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න.)

දිනය :————.

03-388

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල**
**පුස්තකාලයාධිපති සේවයේ (III වන පන්තිය) තනතුරු සඳහා බඳවා ගැනීමේ**
**විවෘත/ සීමිත තරග විභාගය - 2017 සඳහා අයදුම්පත් කැඳවීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2047 හා 2017.11.24 දින ගැසට් පත්‍රයේ IV (අ) කොටසෙහි පලකරන ලද, මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල පුස්තකාලයාධිපති සේවයේ (III වන පන්තිය) තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත/ සීමිත තරග විභාගය – 2017 සඳහා අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය 2018.03.23 දින දක්වා දීර්ඝ කරන බව දැනුම් දෙමි.

එච්. එම්. එම්. යූ. බී හේරත්,
පළාත් පාලන කොමසාරිස්,
මධ්‍යම පළාත.

03-431

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.